*සැ.යු.*: 2025.10.31 දින පළ කරන ලද අංක 2461 *ගැසට්* පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,462 - 2025 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2025.11.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 2850 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 2869 |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 නොවැම්බර් මස 28 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2847 - B 82735 - (2025/11)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඊ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) තනතුරේ
III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පවතින නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) තනතුරෙහි III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 02 ක් සඳහා සුදුස්සන් තෝරාගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරාගනු ලබයි.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

2.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන් හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.2 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

2.4 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.5 විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**03. වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

**රු. 82,150- 10x2,400- 8x2,940- 17x3,900 - රු. 1,95,970/- (SL-1- 2025)** වේ.

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

**04. බඳවා ගැනීමේ සුදුසුකම්:**

4.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

4.2 පළපුරුද්ද :

නීතිඥවරයෙකු වශයෙන් මාස 06 ක සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

4.3 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 28 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

4.4 කායික/ මානසික සුදුසුකම් **:**

සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.5 අනෙක් සුදුසුකම් :

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලකුණු ලබාදෙන පටිපාටිය පහත වගුව පරිදි වේ.

| | පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ. |
| 2 | අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3 | අතිරේක පළපුරුද්ද | 20 | |
| 4 | පරිගණක සාක්ෂරතාව | 15 | |
| 5 | භාෂා ප්‍රවීණතාව | 15 | |
| 6 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතා | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | | **100** | |

**06. අයදුම් කිරීමේ ක්‍රමය :**

අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව විය යුතු අතර A4 කඩදාසිවල සකස් කළ යුතුවේ. අදාළ තොරතුරු පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. අයදුම්පත් යොමු කිරීම :**

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2025.12.03** දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573,
අලුත්කඩේ,
කොළඹ 12.

**08. අයදුම්පත් කැඳවන අවසාන දිනය 2025.12.03 දින වේ. එම දිනට අදාළ සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුය.**

09. දැනට රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතන) නියුතු නිලධාරින්ගේ අයදුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

10. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) III ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.)

11. අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 ඔක්තෝබර් මස 31 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා** [ ]

**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025**

**01.පෞද්ගලික තොරතුරු :**

1.1 සම්පූර්ණ නම (සිංහල) : ..............................................................................................................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි) :..............................................................................................................

1.3 මුලකුරු සමඟ නම (සිංහල) : ..............................................................................................................

1.4 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි) : ..............................................................................................................

1.5 ස්ථිර ලිපිනය (සිංහල) : ..............................................................................................................
..............................................................................................................

1.6 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි) : ..............................................................................................................................
..............................................................................................................................................................

1.7 ස්ත්‍රී / පුරුෂ භාවය : ..............................................................................................................................

1.8 විවාහක / අවිවාහක : ..............................................................................................................................

1.9 ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................................................................

1.10 උපන් දිනය : වර්ෂය : ............................ මාසය : ......................... දිනය : ..............................................

1.11 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවු : .................. මාස : .................. දින : ....................................

1.12 දුරකථන අංකය : (ස්ථාවර) : .................................. ජංගම : ................................................................

1.13 විද්‍යුත් තැපැල් ලිපිනය : ..............................................................................................................................

**02.** දැනට දරන තනතුර පිළිබඳ විස්තර : (තිබේනම්)

2.1 දැනට දරන තනතුර : ..............................................................................................................................

2.2 පත්වීම් දිනය : ..............................................................................................................................

2.3 පත්වීමේ ස්වභාවය (ස්ථිර, පරිවාස) : ..............................................................................................

**03.**අධ්‍යාපන සුදුසුකම් : (සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලේඛනවල සහතික පිටපත් අමුණන්න)

3.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දුන් දිනය : ..................................................................

3.2 ක්‍රියාකාරීව නීතිඥ වෘත්තියෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය : ....................................................................

04. වෘත්තීය සුදුසුකම් : ..............................................................................................................................

05. වෙනත් සුදුසුකම් : ..............................................................................................................................

06. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය :

6.1.1. නම : ..............................................................................................................................

6.1.2. ලිපිනය : ..............................................................................................................................

6.1.3. රැකියාව : ..............................................................................................................................

6.1.4. ඔබව හඳුනන කාල පරිච්ඡේදය : ..............................................................................................

6.2.1. නම : ..............................................................................................................................

6.2.2. ලිපිනය : ..............................................................................................................................

6.2.3. රැකියාව : ..............................................................................................................................

6.2.4. ඔබව හඳුනන කාල පරිච්ඡේදය : ..............................................................................................

**07. අයදුම්කරුගේ සහතිකය**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙහි සඳහන් කරුණු සාවද්‍ය බව අනාවරණය වුවහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

.......................................................... ............................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................................. මහතා / මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිටදී .................................................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

.................................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය : ......................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .................................................
තනතුර : ..................................................
ලිපිනය : ..................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**09. ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.............................................................................. මහතා / මහත්මිය / මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ ස්ථිර සේවකයෙකු / සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුරට අදාළව *ගැසට්* පත්‍රයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් පවතින / නොපවතින බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

..............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන

දිනය : ......................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .................................................
තනතුර : ..................................................
ලිපිනය : ..................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

## අධිකරණ සේවා කොමිෂන් සභාව

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ විමර්ශන නිලධාරී තනතුරේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පවතින විමර්ශන නිලධාරී තනතුරෙහි II ශ්‍රේණියෙහි පවතින පුරප්පාඩු 01 ක් සඳහා සුදුස්සකු තෝරාගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාදෙන ලකුණු මත තෝරාගනු ලබයි.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

2.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන් හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.2 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

2.4 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.5 විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

03.වැටුප් පරිමාණය:

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය
රු. 58660- 10x1190- 11x1360- 15x1670 - 110570/- (MN-5- 2025) වේ.

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

04.බඳවා ගැනීමේ සුදුසුකම්:

1.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන නීතිය, අපරාධ විද්‍යාව හා සමාජ විද්‍යාව සම්බන්ධව උපාධියක් ලබා තිබීම.

1.2 පළපුරුද්ද

එක් වසරක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

1.3 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 28 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

1.4 කායික/ මානසික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.5 අනෙක් සුදුසුකම්

(I.) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(II.) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(III.) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලකුණු ලබාදෙන පටිපාටිය පහත වගුව පරිදි වේ:

| | පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ. |
| 2 | අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3 | අතිරේක පළපුරුද්ද | 20 | |
| 4 | පරිගණක සාක්ෂරතාව | 15 | |
| 5 | භාෂා ප්‍රවීණතාව | 15 | |
| 6 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතා | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | | 100 | |

06. අයදුම් කිරීමේ ක්‍රමය :

අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව විය යුතු අතර A4 කඩදාසිවල සකස් කළ යුතුවේ. අදාළ තොරතුරු පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් යොමු කිරීම :

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2025.12.03** දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573,
අලුත්කඩේ,
කොළඹ 12.

08. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.12.03** දින වේ. එම දිනට අදාළ සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුය.

09. දැනට රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතන) නියුතු නිලධාරීන්ගේ අයදුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

10. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " විමර්ශන නිලධාරී II ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.)

11. අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 ඔක්තෝබර් මස 31 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා** [ ]

**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ විමර්ශන නිලධාරී තනතුරේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025**

**01.පෞද්ගලික තොරතුරු :**

1.1 සම්පූර්ණ නම (සිංහල) : ..........................................................................................................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි) :..........................................................................................................

1.3 මුලකුරු සමඟ නම (සිංහල) : ..................................................................................................

1.4 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි) : .................................................................................................

1.5 ස්ථිර ලිපිනය (සිංහල) : ..............................................................................................................

..........................................................................................................................................

1.6 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි) : ..................................................................................................
..................................................................................................................................

1.7. ස්ත්‍රී / පුරුෂ භාවය : .........................................................................................................

1.8 විවාහක / අවිවාහක : ..................................................................................................

1.9 ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................................................

1.10 උපන් දිනය : වර්ෂය : ............................ මාසය : ........................ දිනය : ................................

1.11 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවු :............ මාස : .................... දින : .......................

1.12 දුරකථන අංකය : (ස්ථාවර) ............................... ජංගම .......................................

1.13 විද්‍යුත් තැපැල් ලිපිනය : ...........................................................................................

**02.** දැනට දරන තනතුර පිළිබඳ විස්තර : (තිබේනම්)

2.1 දැනට දරන තනතුර : ....................................................................................................

2.2 පත්වීම් දිනය : .............................................................................................................

2.3 පත්වීමේ ස්වභාවය (ස්ථිර, පරිවාස) : ........................................................................

**03.**අධ්‍යාපන සුදුසුකම් : (සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලේඛනවල සහතික පිටපත් අමුණන්න)

| අනු අංකය | උපාධිය | විශ්ව විද්‍යාලය | උපාධිය ලද දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

**04.** අතිරේක අධ්‍යාපන සුදුසුකම් : (සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලේඛනවල සහතික පිටපත් අමුණන්න)

| අනු අංකය | සුදුසුකම | ආයතනය | සුදුසුකම ලද දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

**05.** වෘත්තීය සුදුසුකම් :

| අනු අංකය | සුදුසුකම | ආයතනය | සුදුසුකම ලද දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

**06.** වෙනත් සුදුසුකම් : ..................................................................................................................

**07. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය :**

7.1.1. නම : ......................................................................................................................................................

7.1.2. ලිපිනය : ..............................................................................................................................................

7.1.3. රැකියාව : .............................................................................................................................................

7.1.4. ඔබව හඳුනන කාල පරිච්ඡේදය : .......................................................................................................

7.2.1. නම : ......................................................................................................................................................

7.2.2. ලිපිනය : ..............................................................................................................................................

7.2.3. රැකියාව : .............................................................................................................................................

7.2.4. ඔබව හඳුනන කාල පරිච්ඡේදය : .......................................................................................................

**08. අයදුම්කරුගේ සහතිකය**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත්, මෙහි සඳහන් කරුණු සාවද්‍ය බව අනාවරණය වුවහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

.........................................................., ................................................................,
දිනය. අයදුම්කරුගේ අත්සන.

**09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................ මහතා/ මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවද ඔහු/ ඇය මා ඉදිරිපිටදී ................................................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

.................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : ......................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .................................................
තනතුර : ..................................................
ලිපිනය : ..................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**10. ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

............................................................................. මහතා / මහත්මිය / මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ ස්ථිර සේවකයෙකු / සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුරට අදාළව *ගැසට්* පත්‍රයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් පවතින / නොපවතින බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය : ......................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .................................................
තනතුර : ..................................................
ලිපිනය : ..................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාව ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු**

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව පුරප්පාඩු පවතින අතර ඒ සඳහා අවම සහ විශේෂ සුදුසුකම් ඒ සමග දක්වා ඇත.

**මූලික අධ්‍යාපන සුදුසුකම් :**

2. සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

3. අවශ්‍ය අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :-

*අ.* **විද්‍යුත්, විදුලි සංදේශ ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණ වෘත්තීන් - නිත්‍ය**

(1) දුරකථන ක්‍රියාකරු ( පිරිමි/කාන්තා)
(2) ගුවන් විදුලි සන්නිවේදක ( පිරිමි/කාන්තා)

සිංහල / දෙමළ විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම

*ආ.* **සිවිල් ඉංජිනේරු වෘත්තීන් ( පිරිමි ) - නිත්‍ය/ ස්වේච්ඡා**

(1) කම්හල්කරු හා පෑස්සුම්කරු
(2) දැව තාක්ෂණික ශිල්පී
(3) ඉදිකිරීම් තාක්ෂණික ශිල්පී
(4) වායු සමීකරණ හා ශීතකරණ කාර්මික ශිල්පී
(5) කාර්මික තාක්ෂණික ශිල්පී

සිංහල / දෙමළ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

තව ද, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික සහතිකය හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*ඇ.* සැපයුම් වෘත්තීන් - ස්වේච්ඡා

**නිල ඇඳුම් පරිස්කාරක ( පිරිමි / කාන්තා)**

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

රෙදිපිළි කර්මාන්තය තුළ යන්ත්‍ර ක්‍රියාකරු (Machine Operator) ලෙස වසර දෙකක (02) සේවා පළපුරුද්දක් ලබා තිබීම හා Pattern making, quality controlling සහ cutter machine handling පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකෙන අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් පවත්වනු ලබන අවසන් ප්‍රායෝගික පරීක්ෂණය (Practical Test) සමත් වීම අනිවාර්ය වේ.

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී**

**4. අවශ්‍ය අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :-**

*අ.* සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) - ස්වේච්ඡා නිල ඇඳුම් නොවන කාණ්ඩය

**(1) රථවාහන කාර්මික ශිල්පී**

සිංහල / දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවලදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පය (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පය, මෝටර් රථ විද්‍යුත් කාර්මික ශිල්පය, මෝටර් රථ වායුසමීකරණ ශිල්පය) පිළිබඳව පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික වෘත්තිය නිපුණතා අදියර II (NVQ Leval II) හෝ ඊට වැඩි සුදුසුකම් ලබා තිබීම;

*සහ*

මෝටර් රථ කාර්මික ශිල්පය හෝ වාහන නඩත්තු වෘත්තියේ වසරක (01) සේවා පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) මතුපිට තාක්ෂණික ශිල්පී

සිංහල / දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවලදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;

. *සහ*

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පය (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පය, මෝටර් රථ විද්‍යුත් කාර්මික ශිල්පය, මෝටර් රථ වායුසමීකරණ ශිල්පය) පිළිබඳව පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික වෘත්තිය නිපුණතා අදියර II (NVQ Leval II) හෝ ඊට වැඩි සුදුසුකම් ලබා තිබීම;

*සහ*

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක රසායනාගාර සහායක සහ තාක්ෂණික ශිල්පය පිළිබඳව පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික වෘත්තිය නිපුණතා අදියර II (NVQ Leval II) හෝ ඊට වැඩි සුදුසුකම් ලබා තිබීම;

*සහ*

අවම වශයෙන් වසරක (01) රසායනාගාර නිරාවරණය සහ කාර්මික ක්ෂේත්‍රය පිළිබඳව හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*ආ.* විද්‍යුත්, විදුලි සංදේශ ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණ වෘත්තීන් - නිත්‍ය

**විදුලි සන්නිවේදන තාක්ෂණික ශිල්පී (පිරිමි)**

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහිතව ගණිතය / විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පරිඝනක ජාලකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) සුදුසුකම් ලබා තිබීම;

*හෝ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක විදුලි සන්නිවේදන තාක්ෂණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) සුදුසුකම් ලබා තිබීම

*ඇ.* සිවිල් ඉංජිනේරු වෘත්තීන් - (පිරිමි/කාන්තා) - නිත්‍ය / ස්වේච්ඡා

**වැඩ මූලික (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික/ ප්‍රමාණ සමීක්ෂණ)**

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසී භාෂාව යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර

දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවලදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂයය ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

ජාතික තාක්ෂණික සහතිකය NCT (Civil/Electrical/ Mechanical Engineering/ Quantity Surveying) අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව හෝ රජයේ වෙනත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඊට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක් සමත්ව තිබීම සහ අදාළ වෘත්තියේ සේවා පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*ඈ.* අධ්‍යාපනික වෘත්තීන් (කාන්තා) - ස්වේච්ඡා නිල ඇඳුම් නොවන කාණ්ඩය

**අධ්‍යාපන සහයිකා (පෙර පාසල් ගුරු)**

සිංහල / දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;

*හෝ*

Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී ජාත්‍යන්තර (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල සටහනේ ඉංග්‍රීසි විෂයය සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සම්මාන සාමාර්ථයක් සඳහා ලබාගතයුතු අවම ලකුණු ප්‍රමාණයට සමාන හෝ ඊට ඉහළ අගයක් සඳහා ලබා දෙනු ලබන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ජාත්‍යන්තර (සා.පෙළ) විභාගය සමත් ව තිබීම;

*සහ*

රජයේ පිළිගත් ආයතනයකින් පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා පෙර පාසල් ගුරු වෘත්තියේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්ද ලබා තිබීම;

*සහ*

රජයේ ලියාපදිංචි මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථානයක පෙර පාසල් ගුරුවරයකු ලෙස වසරකට (01) වැඩි ප්‍රයෝගික පුහුණු පළපුරුද්දක් හෝ මුල් ළමාවිය අධ්‍යාපන වැඩමුළු සහ ළමා සංවර්ධනය පිළිබඳ විශේෂිත පුහුණුවක් සාර්ථකව නිම කිරීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ.

5. **විශේෂ සටහන**

*අ.* Pearson Edexcel International General Certificate of Secondary Education (GCSE) or Cambridge International Ordinary Level විභාගවල දී සිංහල හෝ දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් නොමැති අපේක්ෂකයින් බඳවාගත් දින සිට වසර පහක් ඇතුලත සිංහල හෝ දෙමළ භාෂාව සඳහා අවශ්‍ය සාමාර්ථය ලබාගත යුතු ය.

*ආ.* ඉදුරාම බඳවාගනු ලබන අපේක්ෂකයින්ගේ අ.පො.ස. (සා.පෙළ) වෙනුවට ජාතික වෘත්තීය සුදුසුකම් අදියර III (NVQ Levl III) හෝ ඊට වැඩි සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ පළමු මට්ටම (SLQF 1)හෝ ඊට වැඩි සහ අ.පො.ස (උ.පෙළ) වෙනුවට ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) හෝ ඊට වැඩි සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ දෙවන මට්ටම (SLQF 2) හෝ ඊට වැඩි සහතිකයන් ලබා සිටීම සලකා බලනු ලැබේ.

6. අනෙකුත් සුදුසුකම් :

*අ.* ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්‍ෂකයින් / අපේක්‍ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි:

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි

(2) වයස : 2025 දෙසැම්බර් මස 01 වන දිනට

**නිත්‍ය**

පිරිමි - අවුරුදු 18ත් 23ත් අතර

කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර

ස්වේච්ඡා

පිරිමි - අවුරුදු 18ත් 28ත් අතර
කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර

ඉඳුරාම බඳවා ගැනීම් (නිත්‍ය/ ස්වේච්ඡා)

පිරිමි - අවුරුදු 18-28 ත් අතර
පිරිමි - අවුරුදු 18-30 ත් අතර - මෝටර් රථ කාර්මික ශිල්පී වෘත්තිය සඳහා
කාන්තා - අවුරුදු 18-26 ත් අතර

(3) උස : අඩි 5 අඟල් 4 ට (162 cm නොඅඩු විය යුතුයි (පිරිමි)
අඩි 5 අඟල් 2 ට (157 cm) නොඅඩු විය යුතුයි (පිරිමි)-මෝටර් රථ කාර්මික ශිල්පී වෘත්තිය සඳහා

: අඩි 5 අඟල් 2 ට (157 cm) නොඅඩු විය යුතුයි (කාන්තා)

(4) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
: 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$(\text{ශරීර ස්කන්ධ දර්ශකය}) \quad \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$$

(5) වර්ණ දෘෂ්ටිය : CP2

(6) පෙනීම : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත)

(7) පපුව (පිරිමි) : අඟල් 32ට නොඅඩු විය යුතුය

(8) සිවිල් තත්ත්වය : නිත්‍ය - අවිවාහක
ස්වේච්ඡා/ඉඳුරාම බඳවා ගැනීම් විවාහක / අවිවාහක

(අ) නිත්‍ය ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතු අතර ගුවන් හමුදාවට බැඳී වසර හතරක් (04) ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ආ) අවිවාහක වයස අවුරුදු 25 ට වැඩි බඳවා ගන්නා ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවනතුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ඇ) අවිවාහක ඉඳුරාම බඳවා ගන්නා ගුවන් භටයින්/ ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවීමෙන් පසු විවාහ වීමට අවසර දෙනු ලැබේ.

7. තුන්වන හා හතරවන ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පස්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා නොමැති අපේක්ෂකයින් / අපේක්ෂිකාවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් / අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

8. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

9. සේවා කොන්දේසි :

*අ.* අපේක්ෂකයින් අනෙකුත් නිලයන් හා සමානව මූලිකව නිත්‍ය/ ස්වේච්ඡා සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති වෘත්තිය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තිය පුහුණුව නිමවීමෙන් පසු ඔහු / ඇය අදාළ වෘත්තියේ ගුවන්භටයෙකු / ගුවන් කාන්තාවක ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

*ආ.* ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

*ඇ.* පුහුණුව ලබන කාලසීමාව තුළදී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

*ඈ.* සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

*ඉ.* පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

ඊ. පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකුහට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියළුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු / ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුදා සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු / ඇය වෙනුවෙන් දරා ඇති සියළුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

ඌ. මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 32 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

එ. පළමුවන ඡේදයේ සිට හයවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක් වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

ඒ. අවිවාහක ගුවන් භටයින් / ගුවන් කාන්තාවන්, ගුවන්භට / ගුවන් කාන්තා නිවස්නයන් හි සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

ඔ. විවාහක ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

ඕ. සියළුම ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් රාජකාරී හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

ක. සියළුම ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

10. බඳවා ගැනීමේ කොන්දේසි :

අ. **නිත්‍ය ගුවන් භටයින් හා ගුවන් කාන්තාවන් සඳහා :**

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට / ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුය. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. වසර 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත සේවය දීර්ඝ කිරීමට සුදුසු ගුවන්භටයින්ට / ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

ආ. **ස්වේච්ඡා ගුවන් භට/ ගුවන් කාන්තාවන් සඳහා :**

තෝරාගනු ලබන අපේක්ෂක/ අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05 ක සේවා කාලයකට යටත් විය යුතුයි. වසර 05 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් භට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

ඇ. **නිල ඇඳුම් නොවන කාණ්ඩය ස්වේච්ඡා ගුවන් භට/ ගුවන් කාන්තාවන් සඳහා :**

තෝරාගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 02 ක සේවා කාලයකට යටත් විය යුතුයි. වසර 02 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් භට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

11. **රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් :** තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

12. **වැටුප් හා දීමනා :-**

*අ.* නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් භට/ ගුවන් කාන්තාවන්ට අදාළ මූලික වැටුප සහ දීමනා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *නිලය* | *මූලික වැටුප රු. ශත* | *අනෙකුත් දීමනා + සළාක දීමනා* | *අඩු කිරීම් රහිතව* සම්පූර්ණ වැටුප |
|---|---|---|---|
| ගුවන්භට | 44,293.00 | 22,150.00 + 29,993.43 | 96,436.43 |
| නායක ගුවන්භට | 45,409.00 | 22,150.00 + 29,993.43 | 97,552.43 |
| කෝප්‍රල් | 46,525.00 | 22,150.00 + 29,993.43 | 98,668.43 |

***සැලකිය යුතුයි:*** පිටත වාසය කරන ගුවන් භටයින් /ගුවන් කාන්තාවන් භට මසකට රු 30,000.00ක පමණ ආහාර දීමනා සහ අදාළ පරිදි ගෙවල් කුළී දීමනාව ගෙවනු ලැබේ.

*ආ.* **විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා** වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළු ගුවන්භටයින් / ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව සිදු කරනු ලැබේ.

**13. ඉල්ලුම්කරුට / ඉල්ලුම්කාරියට උපදෙස්:**

*අ.* පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියළුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් **2025 නොවැම්බර් මස 10 දින දහවල් 12.00** ට පෙර ලැබෙනසේ ආධුනිකයින් බඳවා ගැනීමේ ප්‍රධාන නිලධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ)' අයදුම්පතේ ඉහල වම් කෙලවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය / ස්වේච්ඡා ගුවන් භටයින් / ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළයුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කළයුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනාවූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

*ආ.* රජයේ සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඔහු/ ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමඟ තිබිය යුතුයි.

*ඇ.* අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍ර www.airforce.lk/joinus/apply යන වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*ඈ.* සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) ජාතික හැඳුනුම්පත

(3) අයදුම්කර ඇති වෘත්තියට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල්පිටපත් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතුය)

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(5) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මාස 06කට නොඅඩු කාලයකින්). ඉන් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල් පිටපත් හා ඡායාපිටපත බැගින්.

(7) මාස හයක් (6) ඇතුළත ලබාගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්

(10) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අභල් 2 x 2 1/2 උඩුකය වර්ණ ඡායාරූපයක්.

ඉ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

ඊ. කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

උ. අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා, ඒවා අස්ථානගත වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

ඌ. අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපුවෙහි වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්ත මත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වලදී ඉවත් කරනු ලැබේ.

14. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්හට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. සම්මුඛ පරීක්‍ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්‍ෂකයින්/ අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්‍ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

15. සම්මුඛ පරීක්‍ෂණය සඳහා අයදුම්කරුවන් / අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුව ද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

16. සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වන අපේක්‍ෂකයින්/ අපේක්ෂිකාවන් ගුවන් හමුදා ප්‍රමිතියට අනුකූලව වෛද්‍ය පරීක්ෂණයට හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුයි.

17. සම්මුඛ පරීක්‍ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්‍ෂකයන්/ අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්‍ෂකයන් / අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණු අනුවය.

18. අපේක්‍ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහු/ ඇය ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙන් පමණි. අපේක්‍ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්‍ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවන්නේය.

19. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

(වී බී එදිරිසිංහ),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී,
ආර්එස්පී (සිව්වරක්), යූඑස්පී,
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී, කිව්එච්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා ගුවන් හමුදාවේ ආධුනික ගුවන් භට/ ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත**
**ගුවන් හමුදාවේ..................................................................................... වෘත්තිය**

1. පුරවැසිභාවය : ......................................................................................................................................
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) : ..........................................................................................................
......................................................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................................................

4. ස්ථිර ලිපිනය :....................................................................................................

5. තැපැල් ලිපිනය : ....................................................................................................

6. උපන් දිනය :

(2025 දෙසැම්බර් මස 01 දිනට) අවු : ......................... මාස : ...................... දින : ....................

7. උස : සෙන්ටිමීටර්....................(අඩි.......... අඟල් ...........)

8. පපුව : අඟල් ..................... (පිරිමි)

9. බර : කිලෝග්‍රෑම් .....................

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ....................................................................................................

11. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර : ....................................................................................................

12. දිස්ත්‍රික්කය : ..................................................................................

13. ඡන්ද කොට්ඨාසය : ....................................................................

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය : ....................................................................................................

15. දුරකථන අංක : .................................................... WhatsApp අංකය : ..........................................................................

විද්‍යුත් ලිපිනය : ..................................................................................

16. විවාහක හෝ අවිවාහක බව : ....................................................................

17. ස්ත්‍රී පුරුෂ භාවය : ....................................................................

18. අධ්‍යාපනය ලැබූ පාසල් : ප්‍රාථමික ....................................................................................................

ද්විතීක ....................................................................................................

19. පාසල් සහ/ හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :-

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (උ.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම් | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :..........................................................................................................................

21. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

22. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | වර්තමාන ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා :- | | | | |
| මව :- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ :- | | | | |

23. ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ කලින් සන්නද්ධ සේවයක් වේනම් ඒ පිළිබඳව විස්තර :
(දැනට සේවයෙන් ඉවත්ව ගොස් ඇත්නම් ඉවත් වූ අකාරය සඳහන් කරන්න, නීතිමය ගැටළු ද ඇතුළත්ව)

| නිළය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

24. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර :- (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා

| අනු අංක | විස්තරය | පාසල් | පළාත් | ජාතික | අන්තර්ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |

25. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න.) :
..........................................................................................................................................................

26. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :

.............................................................................................................................................................................................

27. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම්කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න.: ..................................................

.............................................................................................................................................................................................

28. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ...............................

.............................................................................................................................................................................................

29. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :

.............................................................................................................................................................................................

30. චරිත සහතික පිළිබඳ විස්තර :-

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

31. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්භට/ගුවන්කාන්තාවන් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා එයට අදාළවන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය :- ........................................ ..................................................

ඉල්ලුම්කරුගේ අත්සන.

32. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

*අ.* ඉහත අයදුම්පතේ 31 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ................................................................................................................. නැමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

*ආ.* ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී ඉහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

.......................................................................

දෙමාපිය / භාරකරුගේ අත්සන

දිනය : ................................................

නම : ..............................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය : ..........................................................................................................................................................

...................................................................

පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ................................................

නම : ..............................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය : ..........................................................................................................................................................

.................................................................

දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය : ................................................

නම : ..............................................................................................................................................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :..........................................................................................................................................................

11 - 126

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### තුන් අවුරුදු පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා 2023 වර්ෂයේ හෝ 2024 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත ශික්ෂණලාභීන් කණ්ඩායම් දෙකක් (02) එකවර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2025

1.0 **ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක තුන් අවුරුදු පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීම පිණිස අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා යෝග්‍යතාව සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

1.1 මෙය අදාළ වනුයේ 2023 වර්ෂයේ දී හෝ 2024 වර්ෂයේ දී අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත්වූවන් සඳහා පමණි.

1.2 ඒ අනුව 2023 වර්ෂයේ හෝ 2024 වර්ෂයේ දී අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිට ඉන් සමත් වූ අයදුම්කරුවන්ට මේ සඳහා අයදුම් කළ හැකි ය.

1.3 සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය (Online System) ඔස්සේ *ගැසට්* නිවේදනයේ 10.0 හි "අයදුම් කිරීම සඳහා උපදෙස්" ඡේදයේ සඳහන් උපදෙස් අනුව අයදුම් කළ යුතු වේ.

1.4 2023 හා 2024 වර්ෂවලට අදාළව ඉල්ලුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වර්ෂ දෙකටම අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වර්ෂ දෙක සඳහා වෙන වෙනම අයදුම් කළ යුතු වේ.

1.5 අයදුම් කිරීම **2025.11.28** දින හෝ ඊට පෙර සිදු කළ යුතු ය.

1.6 *ගැසට්* නිවේදනයේ සඳහන් සියලු කරුණු හොඳින් කියවා අවබෝධ කරගෙන ඒ අනුව මාර්ගගතව (Online) අයදුම් කිරීමේ වගකීම අයදුම්කරු සතු වේ. නිවැරදිව ඉදිරිපත් නොකරන අයදුම්පත් පිළිබඳව පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

1.7 අයදුම් කිරීමට පෙර *ගැසට්* නිවේදනයේ 14.0 යටතේ 14.1 සිට 14.8 දක්වා වගුවල සඳහන් කර ඇති එක් එක් පාඨමාලාව සඳහා 2023 සහ 2024 වර්ෂවල අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත බඳවාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳ විශේෂ අවධානය යොමු කර දිස්ත්‍රික්ක පදනමින් හා ජාතික පදනමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබා ගෙන අයදුම් කිරීම කළ යුතු වේ.

2.0 **යෝග්‍යතාව**

සෑම අයදුම්කරුවකුම -

2.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

2.2 විශිෂ්ට චරිතයකින් ද, යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් ද යුක්ත විය යුතු ය.

2.3 වයස :

2.3.1 2025.01.01 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතු ය.

2.3.2 පූජ්‍ය පක්ෂය / පූජක පක්ෂය අදාළ ආගමික පාඨමාලාවලට පමණක් අයදුම් කළ යුතු අතර එම අයදුම්කරුවන් 2025.01.01 දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

2.4 අවිවාහක විය යුතු ය.

3.0 **මූලික අධ්‍යාපන සුදුසුකම් :**

3.1 3.1.1 බුද්ධ ධර්මය පාඨමාලාව හැර අනෙකුත් සියලු පාඨමාලා සඳහා අයදුම් කරන සියලුම අයදුම්කරුවන් විද්‍යාපීඨ ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා පහත දක්වා ඇති 3.2 හා 3.3.1 හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

3.1.2 බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ දී පමණක් 3.2 සුදුසුකම සමගින් 3.3.1 හෝ 3.3.2 යන සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතු වේ.

3.2 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂය තුනකින් (03) එකවර සමත් වීම.

3.3 3.3.1 අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාව (සිංහල භාෂාව/දෙමළ භාෂාව) හා ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්ව, විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථය ලබා තිබීම අනිවාර්ය වේ. මෙම සුදුසුකම් දෙවරක දී සම්පූර්ණ කරන්නේ නම්, විභාගයට පෙනී

සිටි පළමු වාරයේ දී මාධ්‍ය භාෂාව (සිංහල භාෂාව / දෙමළ භාෂාව) ඇතුළුව විෂයයන් පහකින් (05) සමත්ව සම්මාන සාමාර්ථ තුනක් (03) ලබා තිබීම අනිවාර්ය වේ.

සිංහල මාධ්‍ය පාඨමාලා සඳහා අදාළ මාධ්‍ය භාෂාව සිංහල භාෂාවවන අතර, දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා අදාළ මාධ්‍ය භාෂාව දෙමළ භාෂාව වේ.

*සැලකිය යුතුයි:-*

සිංහල හෝ දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා ඉහත අ.පො.ස. (උ.පෙළ) විභාගය අදාළ භාෂා මාධ්‍යයෙන් සමත් විය යුතුය.

3.3.2 බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා අයදුම් කරනු ලබන්නන් ඉහත 3.3 හි 3.3.1 සුදුසුකම හෝ මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ගණිතය, සිංහල භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන සාමාර්ථ තුනක් (03) සහිත ව සමත් වීම.

3.4 ඉහත 3.2 හා 3.3 හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ එක් එක් පාඨමාලාවට අවශ්‍ය විශේෂ අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් තෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කර තිබිය යුතුය.

3.5 එක් එක් පාඨමාලාව සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම් ඒ ඒ පාඨමාලාව යටතේ දක්වා ඇත.

*සැලකිය යුතු යි:-*

(අ) අ.පො.ස. (සා.පෙළ) විෂය නිර්දේශය යටතේ පහත සඳහන් විෂය සලකා බලනු ලැබේ.

හර (ප්‍රධාන) විෂය :-

(i) ආගම
(ii) සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය
(iii) ඉංග්‍රීසි භාෂාව
(iv) ගණිතය
(v) ඉතිහාසය
(vi) විද්‍යාව

කාණ්ඩ විෂය :-

(i) පළමුවන විෂය කාණ්ඩයේ විෂය අතරින් ඕනෑම විෂයයක්
(ii) දෙවන විෂය කාණ්ඩයේ විෂය අතරින් ඕනෑම විෂයයක්
(iii) තුන්වන විෂය කාණ්ඩයේ විෂය අතරින් ඕනෑම විෂයයක්.

(ආ) මූලික පිරිවෙන් අවසාන විභාගය යටතේ සලකා බලනු ලබන විෂය :-

(i) සිංහල
(ii) පාලි
(iii) සංස්කෘත
(iv) ඉංග්‍රීසි
(v) ගණිතය
(vi) ත්‍රිපිටක ධර්මය

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලා සඳහා අයදුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව පහත සඳහන් පරිදි සපුරා තිබිය යුතු වේ.

3.6.1 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම් කරන අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම අනිවාර්ය වේ.

*සැ.යු.* - 2025 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීමේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂා විෂයයට අධි සම්මාන සාමාර්ථයක් (B) ලබා තිබීම අනිවාර්යය වේ.

3.6.2 බටහිර සංගීතය පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වුව ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙන්ම අනිකුත් මාධ්‍යවලින් අ.පො.ස. (උ.පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ට ද මේ සඳහා අයදුම් කළ හැකිය.

3.6.3 **සියලු ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා විභාග ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන හෙයින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට හැකි අයදුම්කරුවන් පමණක් මේ සඳහා ඉල්ලුම් කිරීම යෝග්‍ය වේ.**

3.7 චිත්‍ර / නැටුම් (පෙරදිග) / නැටුම් (භරත) / සංගීතය (පෙරදිග) / සංගීතය ( කර්ණාටක) / නාට්‍ය හා රංගකලාව පාඨමාලා සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවන අයදුම්කරුවන් පහත සඳහන් පරිදි ශ්‍රේණිගත කර තෝරාගනු ලැබේ.

අයදුම්කරුවන් අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ලබා ඇති Z අගයේ කුසලතාව අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී

පවත්වන විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම අනිවාර්ය වේ. මෙම විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයෙන් අවම ලකුණු 40 ක් ලබා ගැනීම අනිවාර්යවන අතර අවම ලකුණු ප්‍රමාණය ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවාගැනීමට සුදුසුකම් නොලබයි. තෝරාගැනීම සිදු කරනුයේ අයදුම්කරුවන් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී අදාළ සෞන්දර්යය විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය ඉහළ අගය සිට පහළ අගය අනුපිළිවෙලට සකස් කර ඔවුන්ගේ Z අගය ද ඒ සමග ගලපා සකස් කරනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව දිස්ත්‍රික්ක පදනමිනි. දිස්ත්‍රික් පදනමෙන් තෝරාගැනීම් අවසන් වූ පසු ජාතික පදනමින් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කෙරේ. ඒ අනුව ඉහළ Z අගයක් සහිතව ඉහළම ශ්‍රේණියක් අදාළ සෞන්දර්යය විෂයයට හිමි කර ගත් අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

සම්මුඛ පරීක්ෂණයේ දී විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ලබා දෙන අතර, එහි දී අදාළ විෂයයට උ.පෙළ විභාගයේ දී ලබා ගත් ශ්‍රේණිය පදනම් කරගෙන පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

A - සාමාර්ථය සඳහා ලකුණු 15<br>
B - සාමාර්ථය සඳහා ලකුණු 10<br>
C - සාමාර්ථය සඳහා ලකුණු 05<br>
S - සාමාර්ථය සඳහා ලකුණු 01

3.8 **<u>සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන සියලුම අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල වලංගු දිනය අයදුම් කිරීමේ අවසාන දින (2025.11.28) හෝ ඊට පෙර දිනයක් හෝ විය යුතුය.</u>**

**4.0 එක් එක් පාඨමාලා සඳහා අවශ්‍ය සුදුසුකම් :-**

පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම වැදගත්ය.

***සැලකිය යුතුයි :-***

(අ) පාඨමාලා මාධ්‍ය තෝරාගැනීමේ දී *ගැසට්* නිවේදනයේ 5.0 හි දැක්වෙන වගුවේ සඳහන් එක් එක් පාඨමාලා පැවැත්වෙන මාධ්‍යය පිළිබඳව හා එක් එක් පාඨමාලා සඳහා අවශ්‍යවන සුදුසුකම් පිළිබඳව වඩාත් පැහැදිලි අවබෝධයක් ලබා ගනිමින් අයදුම් කළ යුතු වේ.

(ආ) ඉහත 3.0 හි 3.2 හා 3.3 හි දක්වා ඇත්තේ විද්‍යාපීඨ ප්‍රවේශයට අයදුම් කිරීම සඳහා අ.පො.ස. (උ.පෙළ) හා (සා.පෙළ), මූලික පිරිවෙන් අවසාන යන විභාගවල දී සම්පූර්ණ කළ යුතු අවම මූලික අධ්‍යාපන සුදුසුකම් වේ. ඊට අමතරව එක් එක් පාඨමාලා සඳහා විශේෂිතව සම්පූර්ණ කළ යුතු විෂය ප්‍රවීණතා ඒ ඒ පාඨමාලා යටතේ දක්වා ඇත.

(ඇ) එක් එක් පාඨමාලාව යටතේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට හෝ / හා තෝරාගැනීම සිදු කිරීමට අදාළව දක්වා ඇති කෝටා අගයන්, ප්‍රමුඛතා අනුපිළිවෙල ආදී වූ සියලු කරුණු 2023 හා 2024 වර්ෂ යටතේ වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබේ.

(ඈ) ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවේ දී අයදුම්කරුවන්ගේ ක්‍රීඩා ලකුණු අනුපිළිවෙල මත ද, ඉංග්‍රීසි හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය පාඨමාලා සහ කෝටා අගයක් දක්වා ඇති සෙසු පාඨමාලාවල දී ඒ සම්බන්ධව *ගැසට්* නිවේදනයේ සඳහන් කර ඇති වගන්ති ප්‍රකාරව ද, සෙසු පාඨමාලාවල දී *ගැසට්* නිවේදනයේ සඳහන් ක්‍රමවේදය ප්‍රකාරව අයදුම්කරුවන්ගේ Z අගයේ අනුපිළිවෙල අනුව ද සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවනු ලැබේ.

(ඉ) යම් දිස්ත්‍රික්කයකින් හෝ ජාතික පදනමින් ඒ ඒ පාඨමාලාවට බඳවා ගනු ලබන මුළු සංඛ්‍යාවෙන් අදාළ කෝටාවට හිමි අගයට දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාව මාර්ගගත දත්ත පද්ධතියේ තොරතුරු අතරින් පරිගනක වැඩසටහනක් මඟින් තෝරා සහතික හා යෝග්‍යතාව පරීක්ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඒ අතරින් සුදුසුකම් අනුපිළිවෙල මත නියමිත අයදුම්කරුවන් ප්‍රමාණය තෝරාගනු ලැබේ.

(ඊ) පාඨමාලා සඳහා සම්මුඛ පරීක්ෂණවලට කැඳවූ සියලුම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටීම අනිවාර්යයවන අතර ගුරු වෘත්තියට පිවිසීමට සුදුසු කායික හා මානසික ශක්‍යතාව මෙහි දී පරීක්ෂා කෙරේ. සෞන්දර්ය පාඨමාලාවන් හා සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවන අයදුම්කරුවන් මීට අමතරව විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම අනිවාර්යය වේ.

(උ) එක් එක් පාඨමාලා සඳහා සුදුසුකම් සලකා බලනු ලබන කාණ්ඩ කිහිපයක් පැවතිය හැකි වුව ද යම් යම් දිස්ත්‍රික්කවලට වෙන් කර ඇති සමස්ත කෝටා අගය අනුව අදාළ ප්‍රතිශතාත්මක ගණනය කිරීමේ දී සමහර කාණ්ඩ සඳහා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ හා බඳවා ගැනීමේ අවස්ථාව නොමැති විය හැක. අයදුම් කිරීමේ දී ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීම අයදුම්කරුවන් සඳහා වඩාත් වාසිදායක විය හැක.

(ඍ) යම් පාඨමාලාවකට කාණ්ඩ කිහිපයක් යටතේ බඳවා ගැනීමේ දී එක් එක් කාණ්ඩවලට සමස්ත පුරප්පාඩු ප්‍රමාණයෙන් ප්‍රතිශතාත්මකව නියමිත සංඛ්‍යාව වෙන් කරනුයේ *ගැසට්* නිවේදනයේ දක්වා ඇති එම එක් එක් පාඨමාලාවේ කාණ්ඩ අංක අනුපිළිවෙලට ප්‍රමුඛතාව ලැබෙන පරිදිය.

(එ) "තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල" සඳහන් කර ඇති පාඨමාලාවල දී එම අනුපිළිවෙල සලකා බලනුයේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව තෝරා ගැනීමේ දී ය.

(ඒ) ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවේ දී එක් එක් කාණ්ඩය යටතේ ක්‍රීඩා ලකුණු මත ද, තෝරා ගැනීමේ විශේෂ ක්‍රමවේද ඒ ඒ පාඨමාලා යටතේ සඳහන් කර ඇති අවස්ථාවල දී ඒ අනුව ද, සෙසු පාඨමාලාවල දී සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගේ Z අගය අනුපිළිවෙල මත ද බඳවා ගැනීමේ පදනමට යටත්ව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(ඔ) යම් ආගමික පාඨමාලාවක් සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් අයදුම් කළ හැකි වන්නේ අයදුම්කරු අදහන ආගමට අදාළ පාඨමාලාව සඳහා පමණි. අයදුම්කරු අදහන ආගම හැර වෙනත් ආගමක පාඨමාලාවක් සඳහා අයදුම් කළ නොහැක.

❖ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට බඳවා ගැනීම සඳහා අදාළවන අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ සුදුසුකම් පහත දැක් වේ.

| | | | |
|---|---|---|---|
| **පාඨමාලා අංකය** | **01** | **-** | **ප්‍රාථමික අධ්‍යාපන (සිංහල)** |
| | **02** | **-** | **ප්‍රාථමික අධ්‍යාපන (දෙමළ)** |

4.1

4.1.1 අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී කලා විෂය ධාරාව සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයය සහිතව හදාරන ලද අයදුම්කරුවන් :

4.1.1.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයට කලා විෂය ධාරාවෙන් පෙනී සිට සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයය සහිතව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.1.1.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය යන විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍ය හා ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සමත් වීම;

*හෝ*

4.1.2 අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව/ දෙමළ භාෂාව විෂයය රහිත ව යම් විෂය ධාරාවක් හදාරන ලද අයදුම්කරුවන් :

4.1.2.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී කලා විෂය ධාරාවෙන් පෙනී සිට සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයය රහිතව විෂය තුනකින් (03) එකවර සමත් වීම ;

*හෝ*

4.1.2.2 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී විද්‍යා (භෞතීය විද්‍යා / ජීව විද්‍යා), වාණිජ්‍ය, 'වෙනත්', තාක්ෂණවේදය යන ඕනෑම විෂය ධාරාවකින් පෙනී සිට විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.1.2.3 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාවට (සිංහල / දෙමළ) අවම වශයෙන් අධි සම්මානයක් හා ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව සමත් වීම.

*සැලකිය යුතු යි :-*

**බඳවා ගැනීමේ දී එක් එක් දිස්ත්‍රික්කයෙන් ප්‍රාථමික අධ්‍යාපනය පාඨමාලාවට ඇතුළත් කර ගන්නා මුළු සංඛ්‍යාවෙන් :**

i. අ.පො.ස. (උ.පෙළ) විභාගයට කලා විෂය ධාරාවෙන් පෙනී සිට සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයයක් ලෙස හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60% ක් ද,

ii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා නොමැති කලා විෂය ධාරාවේ අයදුම්කරුවන්ගෙන් 10%ක්, විද්‍යා (භෞතීය විද්‍යා / ජීව විද්‍යා) විෂය ධාරාවේ අයදුම්කරුවන්ගෙන්

10% ක් සහ වාණිජ්‍ය විෂය ධාරාව හදාරන ලද අයදුම්කරුවන්ගෙන් 10% ක් බැගින් ද,

iii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී 'වෙනත්' විෂය ධාරා යටතේ හදාරන ලද අයදුම්කරුවන්ගෙන් 5% ක් සහ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන ලද අයදුම්කරුවන්ගෙන් 5% ක් බැගින් ද, වනසේ නියමිත අයදුම්කරුවන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

iv. නියමිත විෂය ධාරාවෙන් දිස්ත්‍රික්ක / පළාත් / ජාතික යන සියලු කුසලතා අනුපිළිවෙලට අයදුම්කරුවන් ප්‍රමාණවත්ව නොසිටින අවස්ථාවල දී අ.පො.ස.(උ.පෙළ) විභාගයේ කලා විෂය ධාරාව සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයය රහිතව හදාරන ලද අයදුම්කරුවන්ට හා වාණිජ්‍ය විෂය ධාරාව හදාරා ඇති අයදුම්කරුවන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව ලැබෙන සේ ජාතික මට්ටමින් ඉතිරි පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| පාඨමාලා අංකය | 03 | - | විද්‍යාව (සිංහල) |
| | 04 | - | විද්‍යාව (දෙමළ) |
| | 05 | - | විද්‍යාව (ඉංග්‍රීසි) |

4.2

4.2.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂයධාරාවට අයත් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යා යන විෂය තුනකින් (03) එකවර සමත් වීම ;

*හා*

4.2.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිතව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ගණිතය, විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන සාමර්ථ සහිතව සමත් වීම.

***සැලකිය යුතු යි :-***

**විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍ය) පාඨමාලාව සඳහා:**

මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 80%ක ප්‍රමාණය අ.පො.ස.(උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද අයදුම්කරුවන් ද. ඉතිරි 20% ක ප්‍රමාණය අ.පො.ස.(උ.පෙළ) සිංහල / දෙමළ මාධ්‍යයෙන් හදාරන ලද අයදුම්කරුවන් ද වනසේ තෝරාගනු ලැබේ. (සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උ.පෙළ) හදාරන ලද අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී, ඔවුන් අතරින් අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.)

මෙහි දී අ.පො.ස.(උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරූ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී අ.පො.ස.(උ.පෙළ) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් හෝ හදාරා ඇති සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතරින් ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| පාඨමාලා අංකය | 06 | - | ගණිතය (සිංහල) |
| | 07 | - | ගණිතය (දෙමළ) |
| | 08 | - | ගණිතය (ඉංග්‍රීසි) |

4.3

4.3.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, තොරතුරු සන්නිවේදන තාක්ෂණ යන භෞතීය විද්‍යා විෂය ධාරාවට අයත් විෂය තුනකින් (03) එකවර සමත් වීම ;

*හා*

4.3.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන සාමර්ථ සහිතව සමත් වීම.

**සැලකිය යුතු යි :-**

**ගණිතය (ඉංග්‍රීසි මාධ්‍ය) පාඨමාලාව සඳහා :**

මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 80% ක ප්‍රමාණය අ.පො.ස.(උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද අයදුම්කරුවන් ද, ඉතිරි 20% ක ප්‍රමාණය අ.පො.ස. (උ.පෙළ) සිංහල / දෙමළ මාධ්‍යයෙන් හදාරන ලද අයදුම්කරුවන් ද වන සේ තෝරාගනු ලැබේ. (සිංහල / දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උ.පෙළ) හදාරන ලද අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී ඔවුන් අතරින් අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.) මෙහි දී අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරූ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී බඳවා ගැනීමේ පදනම යටතේ අ.පො.ස. (උ.පෙළ) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් හෝ හදාරා ඇති සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතරින් ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| පාඨමාලා අංකය | 09 | - | සමාජයීය විද්‍යාව (සිංහල) |
| | 10 | - | සමාජයීය විද්‍යාව (දෙමළ) |

4.4

4.4.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඉතිහාසය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් හෝ සහිතව කලා විෂය ධාරාවට අයත් විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හෝ*

4.4.2 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ආර්ථික විද්‍යාව විෂයය සහිතව වාණිජ්‍ය විෂය ධාරාවේ විෂය තුනකින් (03) එකවර සමත් වීම ;

*හෝ*

4.4.3 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී භූගෝල විද්‍යාව විෂයය සහිත ව 'වෙනත්' විෂයය ධාරාවේ විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.4.4 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉතිහාසය / පුරවැසි අධ්‍යාපනය / භූගෝල විද්‍යාව යන විෂයයන් ගෙන් එක් විෂයයකට හෝ අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.4.5 මෙම පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන මුළු සංඛ්‍යාවෙන් 60% ක ප්‍රතිශතයක් 4.4.1 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද, 30% ක ප්‍රතිශතයක් 4.4.2 යටතේ අයදුම් කර ඇති අයදුම්කරුවන්ගෙන් ද, 10% ක ප්‍රතිශතයක් 4.4.3 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද වන සේ සුදුසුකම් අනුපිළිවෙලට තෝරාගනු ලැබේ. යම් විෂය ධාරාවක් යටතේ ප්‍රමාණවත් සුදුසුකම්ලාභීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී 4.4.1, 4.4.2, 4.4.3 හි සඳහන් සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව ලැබෙන පරිදි ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

**පාඨමාලා අංකය 11 .- බුද්ධ ධර්මය (සිංහල)**

බුද්ධ ධර්මය පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද, මෙහෙණින් වහන්සේලාට ද, බුද්ධශාසන අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දස සිල් මාතාවන්ට ද, ගිහි අයදුම්කරුවන්ට ද ඉල්ලුම් කළ හැකිය.

4.5

4.5.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ඨාචාරය, පාලි, සංස්කෘත හා සිංහල යන විෂයයන්ගෙන් දෙකක් (02) ඇතුළුව විෂයය තුනකින් (03) එකවර සමත් වීම ;

*හා*

4.5.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිත ව සමත් වීම / මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී 3.0 හි 3.3.2 යටතේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*ඇතුළුව*

4.5.3 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත් වීම;

*හෝ*

4.5.4 ප්‍රාචීණ ප්‍රාරම්භ විභාගයෙන් සමත් වීම ;

*හෝ*

4.5.5 දහම් පාසල් අවසාන විභාගයෙන් සමත් වීම.

4.5.6 පූජ්‍ය පක්ෂය සඳහා සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය (නිට්ටඹුව) වෙන් කර ඇත. සුදුසුකම් ලත් මෙහෙණින්වහන්සේ / දස සිල් මාතාවන් වෙතොත් පූජ්‍ය පක්ෂය යටතේ බඳවාගෙන , සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය (දඹදෙණිය) වෙත යොමු කරනු ලැබේ.

4.5.7 පූජ්‍ය පක්ෂ අයදුම්කරුවන් අතර 2023 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) සමත් වූ පැවිදි අයදුම්කරුවන් නියමිත සංඛ්‍යාව නොමැති නම් 2022, 2021, 2020, 2019 යන වර්ෂ අතුරින් ද 2024 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) සමත් වූ පැවිදි අයදුම්කරුවන් නියමිත සංඛ්‍යාව නොමැති නම් 2023, 2022, 2021, 2020 යන වර්ෂ අතුරින් ද අනුපිළිවෙලින් ආසන්නතම වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) සමත් වූ පූජ්‍ය පක්ෂයට ප්‍රමුඛතාව ලැබෙන පරිදි අවශ්‍ය ඉතිරි අයදුම්කරුවන් සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

4.5.8 පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී පූජ්‍ය පක්ෂය සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. *ගැසට්* නිවේදනය ප්‍රකාරව පූජ්‍ය පක්ෂය සඳහා පවතින පුරප්පාඩුවලට ප්‍රමාණවත් පූජ්‍ය පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට එම ඉතිරි ප්‍රමාණය ගිහි අයදුම්කරුවන්ගෙන් සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය (දඹදෙණිය) සඳහා බඳවා ගනු ලැබේ.

4.5.9 තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල

(අ) 4.5.1, 4.5.2 සහ 4.5.3 සහතික හිමි අයදුම්කරුවන්

(ආ) 4.5.1, 4.5.2 සහ 4.5.4 සහතික හිමි අයදුම්කරුවන්
(ඉ) 4.5.1, 4.5.2 සහ 4.5.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඊ) 4.5.1 සහ 4.5.2 සහතික හිමි අයදුම්කරුවන්

**පාඨමාලා අංකය 12 .- හින්දු ධර්මය (දෙමළ)**

4.6

4.6.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී හින්දු ධර්මය, හින්දු ශිෂ්ඨාචාරය හා සංස්කෘත යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයය තුනකින් (03) එකවර සමත් වීම ;

*හා*

4.6.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී හින්දු ධර්මය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිත ව සමත් වීම ;

*ඇතුළුව*

4.6.3 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම;

*හෝ/හා*

4.6.4 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම ;

*හෝ/හා*

4.6.5 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.

4.6.6. තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල

(අ) 4.6.1, 4.6.2 සහ අනෙකුත් සියලුම සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.6.1, 4.6.2, 4.6.5 සහ අනෙකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
(ඉ) 4.6.1, 4.6.2 සහ අනෙකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
(ඊ) 4.6.1, 4.6.2 සහතික ලැබූ අයදුම්කරුවන්

**පාඨමාලා අංකය 13 - ඉස්ලාම් ධර්මය (දෙමළ)**

4.7

4.7.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය , ඉස්ලාම් ශිෂ්ඨාචාරය හා අරාබි යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.7.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිත ව සමත් වීම;

*ඇතුළුව*

4.7.3 අල්-ආලීම් විභාගය (ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන්ගෙන් හා අවසාන විභාගයේ සියලුම විෂයයන්ගෙන් යන දෙකෙන්ම) සමත් වීම;

*හෝ*

4.7.4 අල්-ආලීම් ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන්ගෙන් සමත් වීම;

*හා*

4.7.5 මෞලවි සහතිකය ලබා තිබීම.

4.7.6 තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල :

(අ) 4.7.1, 4.7.2, 4.7.3 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.7.1, 4.7.2, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඉ) 4.7.1, 4.7.2 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඊ) 4.7.1 සහ 4.7.2 සහතික හිමි අයදුම්කරුවන්

**පාඨමාලා අංකය 14 - කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය (සිංහල)**
**15 - කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය (දෙමළ)**

4.8

4.8.1

4.8.1.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් (03) එකවර සමත් වීම ;

*හා*

4.8.1.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී කතෝලික ධර්මය

/ ක්‍රිස්තියානි ධර්මය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම ;

*හා*

4.8.1.3 අයදුම්කරු කතෝලික ආගම් භක්තිකයෙකු බවට කතෝලික රදගුරු පදවි සහතිකය / ක්‍රිස්තියානි ආගම් භක්තිකයෙකු බවට ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය ලබා තිබීම.

*ඇතුළුව*

4.8.2 කතෝලික ධර්මය අයදුම්කරුවන් තෝරා ගැනීම පහත දැක්වෙන සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී සිදු කරනු ලැබේ.

4.8.2.1 ජාතික දෙව්සත්හලේ දේව ධර්මය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා සහතිකය ලබා තිබීම;

4.8.2.2 ජාතික දෙව්සත්හලේ දර්ශනවාදය පිළිබඳ පාඨමාලා සහතිකය ලබා තිබීම;

4.8.2.3 දේව ධර්මය නිකේතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය ලබා තිබීම;

4.8.2.4 පැවිදිවරයෙකු / පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යයන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) සාර්ථක ව හදාරා අවසන් කළ බවට පැවිදි නිකායන්ගේ ශ්‍රේෂ්ඨාධිපති / ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමන් විසින් හෝ නිකුත් කරන ලද සහතිකය ලබා තිබීම ;

4.8.2.5 ජාතික ධර්මෝපදේශක මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු විභාගයක් සමත් වීම;

*එනම්,*
දහම් ගුරු 03 (අවසාන)
*හෝ*
දහම් ගුරු 02 (මධ්‍යම)
*හෝ*
දහම් ගුරු 01 (ප්‍රථම)

4.8.2.6 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ක්‍රිස්තියානි ධර්මය / ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය විෂයය සමත් වීම.

4.8.3 ක්‍රිස්තියානි ධර්මය අයදුම්කරුවන් තෝරා ගැනීම අනුපිළිවෙලින් පහත දැක්වෙන සුදුසුකම් අනුව සිදු කරනු ලැබේ ;

4.8.3.1 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මඟින් පවත්වනු ලබන ධර්මවේදී උපාධි සහතිකය ලබා තිබීම ;

4.8.3.2 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මඟින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

4.8.3.3 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මඟින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම.

4.8.3.4 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ක්‍රිස්තියානි ධර්මය / ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය විෂයය සමත් වීම.

**සැලකිය යුතු යි :-**

(i) බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40% ක් කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් සුදුසුකම් අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ. 40% ක පූජක පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති වී නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු ගිහි අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 85%ක් 4.8.1 යටතේ සුදුසුකම් ලබන කතෝලික ගිහි අයදුම්කරුවන් අතුරින් 4.8.2 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති අනුපිළිවෙල මත පදනම් ව තෝරා ගනු ලැබේ. 85%ක ප්‍රමාණය සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලත් කතෝලික ගිහි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව ක්‍රිස්තියානි ගිහි අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු ගිහි අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 15%ක් 4.8.1 යටතේ සුදුසුකම් ලබන ක්‍රිස්තියානි ගිහි අයදුම්කරුවන් අතුරින් 4.8.3 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති අනුපිළිවෙල මත පදනම්ව තෝරා ගනු ලැබේ. 15%ක පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලත් ක්‍රිස්තියානි ගිහි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කතෝලික ගිහි අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

(iv) කතෝලික හා ක්‍රිස්තියානි ගිහි අයදුම්කරුවන් පොදුවේ ඔවුන්ගේ Z අගය මත දිස්ත්‍රික්ක පදනමින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර ක්‍රිස්තියානි ගිහි අයදුම්කරුවන් 15% බඳවා ගනු ලබන දිස්ත්‍රික්ක කවරක් ද යන්න සම්මුඛ පරීක්ෂණයට සහභාගීවන ඉහළම Z අගය සහිත ක්‍රිස්තියානි අයදුම්කරුවන් නියෝජනය කරන දිස්ත්‍රික්ක මත හා ඒවායේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව තීරණය කරනු ලැබේ.

(v) පූජක පක්ෂ අයදුම්කරුවන් අතර 2023 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) සමත් වූ පැවිදි අයදුම්කරුවන් නියමිත සංඛ්‍යාව නොමැති නම් 2022, 2021, 2020, 2019 යන වර්ෂ අතුරින් ද 2024 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) සමත් වූ පැවිදි අයදුම්කරුවන් නියමිත සංඛ්‍යාව නොමැති නම් 2023, 2022, 2021, 2020 යන වර්ෂ අතුරින් ද අනුපිළිවෙලින් ආසන්නතම වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) සමත් වූ පූජක පක්ෂයට ප්‍රමුඛතාව ලැබෙන පරිදි අවශ්‍ය ඉතිරි අයදුම්කරුවන් සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

**පාඨමාලා අංකය 16 - සිංහල භාෂාව හා සාහිත්‍යය**

4.9

4.9.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථයක් සහිතව විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.9.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම ;

**පාඨමාලා අංකය 17 - දෙමළ භාෂාව හා සාහිත්‍යය**

4.10

4.10.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.10.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම ;

**පාඨමාලා අංකය 18 - ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය**

4.11

4.11.1

4.11.1.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (විෂයය අංකය 73) ඇතුළු ව විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.11.1.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් / ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත්වීම:

හෝ

4.11.2

4.11.2.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.11.2.2 3.0 හි 3.3.1 ට හා අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම .

*හෝ*

4.11.3

4.11.3.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනක් (03) සමඟ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය එකවර සමත් වීම;

*හා*

4.11.3.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ)

විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

*සැලකිය යුතු යි :-*

බඳවා ගැනීමේ දී 4.11.1 යටතේ ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙමින් ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, බඳවා ගන්නා සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට එම අයදුම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ නම් 4.11.2 යටතේ ඉල්ලුම්කර ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අදාළ බඳවා ගන්නා සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා එම සංඛ්‍යාව ද ප්‍රමාණවත් නොවේ නම් 4.11.3 යටතේ ඉල්ලුම් කර ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙලට ප්‍රමුඛතාව ලැබෙන පරිදි සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4.11.4 තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල

(i) 4.11.1 යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙලට ප්‍රමුඛතාව දෙමින් තෝරා ගනු ලැබේ.

(ii) ඉන් අනතුරුව තවදුරටත් පවතින පුරප්පාඩු 4.11.2 හි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඔවුන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට ලබා ගත් ශ්‍රේණිය ඉහළ සිට පහළට පෙළ ගස්වමින් හා ඒ සමඟ Z අගය ද ගළපමින් තෝරා ගනු ලැබේ.

(iii) ඉහත අංක ii යටතේ තෝරා ගැනීමෙන් අනතුරුව ද පවතින පුරප්පාඩු සඳහා 4.11.3 හි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඔවුන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට ලබා ගත් ශ්‍රේණිය ඉහළ සිට පහළට පෙළ ගස්වමින් හා ඒ සමඟ Z අගය ද ගළපමින් තෝරා ගනු ලැබේ.

**පාඨමාලා අංකය 19 - චිත්‍ර (සිංහල)**
**20 - චිත්‍ර (දෙමළ)**

4.12

4.12.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී චිත්‍ර කලාව විෂයය ඇතුළුව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.12.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී චිත්‍ර විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.12.3 4.12.1 සහ 4.12.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.7 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**පාඨමාලා අංකය 21 - නැටුම් (පෙරදිග)**

4.13

4.13.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී නැටුම් (පෙරදිග) විෂයය ඇතුළුව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.13.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී නැටුම් (පෙරදිග) විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.13.3 4.13.1 සහ 4.13.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.7 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**පාඨමාලා අංකය 22 - නැටුම් (භරත)**

4.14

4.14.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.14.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.14.3 4.14.1 සහ 4.14.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.7 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**පාඨමාලා අංකය 23 - සංගීතය (පෙරදිග)**

4.15

4.15.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී සංගීතය (පෙරදිග) විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.15.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිතව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී සංගීතය (පෙරදිග) විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.15.3 4.15.1 සහ 4.15.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.7 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**පාඨමාලා අංකය 24 - සංගීතය (කර්ණාටක)**

4.16

4.16.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) විෂයය ඇතුළුව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.16.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.16.3 4.16.1 සහ 4.16.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.7 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**පාඨමාලා අංකය 25 - බටහිර සංගීතය (ඉංග්‍රීසි)**

4.17

4.17.1

4.17.1.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී බටහිර සංගීතය විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.17.1.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහ බටහිර සංගීතය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

හෝ

4.17.2

4.17.2.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.17.2.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහ බටහිර සංගීතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම;

හා

4.17.2.3 අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳ 05 වැනි පන්තිය සමත් වීම (න්‍යායික හා ප්‍රායෝගික);

හෝ

4.17.3

4.17.3.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.17.3.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහ බටහිර සංගීතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම;

හා

4.17.3.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී බටහිර සංගීතය විෂයය අමතර විෂයයක් ලෙස සම්මාන සාමාර්ථයක් සමඟ සමත් වී තිබීම;

හෝ

4.17.4

4.17.4.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.17.4.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී බටහිර සංගීතය විෂයයට විශිෂ්ඨ සාමාර්ථයක් ද, ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිත ව සමත් වීම.

**සැලකිය යුතු යි :-**

(i) බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතුය.

(ii) අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී ඉහත 4.17.1, 4.17.2, 4.17.3, 4.17.4 අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාව හිමි වේ.

**පාඨමාලා අංකය 26 .- නාට්‍ය හා රංගකලාව (සිංහල)**
**27 - නාට්‍ය හා රංගකලාව (දෙමළ)**

4.18

4.18.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.18.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.18.3 4.18.1 සහ 4.18.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.7 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**පාඨමාලා අංකය 28 - සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (සිංහල)**
**29 - සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (දෙමළ)**
**30 - සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (ඉංග්‍රීසි)**

4.19

4.19.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

හා

4.19.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී විද්‍යාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම;

හා

4.19.3 පිළිගත් ජවන හා පිටිය මලල ක්‍රීඩා, සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවක්/ දක්ෂතාවක් ලබා තිබීම, (මෙ යටතේ විවිධ ක්‍රීඩා / ඉසව් තුනක් සඳහා ඉදිරිපත් කරන සහතික සලකා බලා, 4.19.3.1 වගුවේ සඳහන් පරිදි උපරිම ලකුණු 75ක් ප්‍රදානය කරනු ලැබේ.)

4.19.3.1 ක්‍රීඩා / ඉසව් සඳහා ලකුණු ලබා දෙනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙල පහත දක්වා ඇති අතර ඒ සඳහා අදාළ කර ගනු ලබන පිළිගත් ක්‍රීඩා නාමලේඛනය 4.19.5 - X වගුවේ දක්වා ඇත.

**ක්‍රීඩා / ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙළ**

| *අනු. අංකය* | *මට්ටම / විෂය* | *කේවල* | *සමූහ* | *ස්ථානය / ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |

| අනු. අංකය | මට්ටම / විෂය | කේවල | සමූහ | ස්ථානය / ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|---|
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 24 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 23 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 22 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 21 |
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 20 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 19 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 18 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 19 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 18 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 17 |
| 14 | ජාතික ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා තරඟාවලිය | කේවල | - | 1 | 16 |
| 15 | ජාතික ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා තරඟාවලිය | කේවල | - | 2 | 15 |
| 16 | ජාතික ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා තරඟාවලිය | කේවල | - | 3 | 14 |
| 17 | ජාතික ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා තරඟාවලිය | - | සමූහ | 1 | 15 |
| 18 | ජාතික ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා තරඟාවලිය | - | සමූහ | 2 | 14 |
| 19 | ජාතික ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා තරඟාවලිය | - | සමූහ | 3 | 13 |
| 20 | පළාත් මට්ටම | කේවල | - | 1 | 16 |
| 21 | පළාත් මට්ටම | කේවල | - | 2 | 15 |
| 22 | පළාත් මට්ටම | කේවල | - | 3 | 14 |
| 23 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 15 |
| 24 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 14 |
| 25 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 13 |
| 26 | රෙජිමේන්තු සැරයන් මේජර් / බලලත් නිලධාරි I ( යුධ/ පොලිස් ) / සමූහ ප්‍රධාන සුළු නිලධාරි (නාවික)/ ප්‍රධාන බලලත් නිලධාරී (ගුවන්)/ හර්මන් ලෝස් කුසලාන ශූරතාව/ ද සොයිසා කුසලාන ශූරතාව/ ශිෂ්‍ය භට පෙරදිග/ අපරදිග තූර්යවාදක (බාලක/ බාලිකා) ශූරතාව | - | - | - | 10 |
| 27 | ජනාධිපති බාලදක්ෂ / බාලදක්ෂිකා | - | - | - | 10 |
| 28 | සාජන්ට් මේජර්/ බලලත් නිලධාරි II (යුධ/ පොලිස්)/ පාලන සුළු නිලධාරී (නාවික)/ බලලත් නිලධාරි (ගුවන්)/ හර්මන් ලෝස් කුසලාන අනුශූරතාව/ ද සොයිසා කුසලාන අනු ශූරතාව/ ශිෂ්‍ය භට පෙරදිග/අපරදිග තූර්යවාදක (බාලක/බාලිකා) අනුශූරතාව | - | - | - | 9 |

| අනු. අංකය | මට්ටම / විෂය | කේවල | සමූහ | ස්ථානය / ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|---|
| 29 | අධ්‍යාපන කලාප/ දිස්ත්‍රික්ක මට්ටම | කේවල | - | 1 | 10 |
| 30 | අධ්‍යාපන කලාප/ දිස්ත්‍රික්ක මට්ටම | කේවල | - | 2 | 9 |
| 31 | අධ්‍යාපන කලාප/ දිස්ත්‍රික්ක මට්ටම | කේවල | - | 3 | 8 |
| 32 | අධ්‍යාපන කලාප/ දිස්ත්‍රික්ක මට්ටම | - | සමූහ | 1 | 9 |
| 33 | අධ්‍යාපන කලාප/ දිස්ත්‍රික්ක මට්ටම | - | සමූහ | 2 | 8 |
| 34 | අධ්‍යාපන කලාප/ දිස්ත්‍රික්ක මට්ටම/ මාණ්ඩලික සැරයන් (යුධ/ පොලිස්)/ ප්‍රධාන සුළු නිලධාරි (නාවික)/ බලපන්ති සැරයන් (ගුවන්)/ හර්මන් ලෝස් කුසලාන තුන්වන ස්ථානය / ද සොයිසා කුසලාන තුන්වන ස්ථානය | - | සමූහ | 3 | 7 |
| 35 | අධ්‍යාපන කොට්ඨාස/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම | කේවල | - | 1 | 6 |
| 36 | අධ්‍යාපන කොට්ඨාස/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම | කේවල | - | 2 | 5 |
| 37 | අධ්‍යාපන කොට්ඨාස/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම | කේවල | - | 3 | 4 |
| 38 | අධ්‍යාපන කොට්ඨාස/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම | - | සමූහ | 1 | 5 |
| 39 | අධ්‍යාපන කොට්ඨාස/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම/ බල ඇණි ශූරතාව (බාලක බලඇණි - 29/බාලිකා - 09) | - | සමූහ | 2 | 4 |
| 40 | අධ්‍යාපන කොට්ඨාස/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම | - | සමූහ | 3 | 3 |

4.19.4 අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ශාරීරික අධ්‍යාපනය විෂයයට ලබා ඇති සාමාර්ථය අනුව පහත දැක්වෙන පරිදි අතිරේක ලකුණු හිමිවන අතර, එය ද ක්‍රීඩා සහතිකපත්වලට හිමි කර ගන්නා ලකුණුවලට එක් කරමින් සමස්ත ක්‍රීඩා ලකුණු සකස් කරනු ලැබේ.

A සාමාර්ථය - 05
B සාමාර්ථය - 03
C සාමාර්ථය - 02
S සාමාර්ථය - 01

4.19.5 පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ. -

(i) ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවට තෝරා ගැනීමේ දී එක් එක් අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන සමස්ත ක්‍රීඩා කුසලතා ලකුණු අනුපිළිවෙල අනුව පහත සඳහන් ක්‍රමවේදයට තෝරාගනු ලැබේ. (4.19.3.1 වගුව හා 4.19.4 මේ සඳහා අදාළ වේ.)

(ii) බඳවා ගැනීමේ දී, මලල ක්‍රීඩා සඳහා කාණ්ඩ අංක 01 යටතේ 30% ක් ද, වොලිබෝල්, දැල්පන්දු සහ පාපන්දු යන ක්‍රීඩාවලින් කාණ්ඩ අංක 02 යටතේ 30% ක් ද සහ 4.19.5-X හි සඳහන් වගුවේ දැක්වෙන අනෙකුත් පිළිගත් ක්‍රීඩාවලින් කාණ්ඩ අංක 03 යටතේ 40% ක් ද වන සේ අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ දී කාණ්ඩ අංක 1, 2, 3 යන අනුපිළිවෙලට ප්‍රමුඛතාව ලැබෙන පරිදි පුරප්පාඩු පුරවනු ලැබේ.

(iii) අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකපත්වලට, ලකුණු ලබාදීමේ නිර්ණායකවලට අනුව ලකුණු ප්‍රදානය කර, එක් එක් කාණ්ඩ යටතේ වෙන් වෙන් ව උපයා ගනු ලබන ලකුණු අතරින් ඉහළ ම ලකුණු මට්ටම අයත් කාණ්ඩය මත අයදුම්කරු අයත්වන කාණ්ඩ අංකය තීරණය කරනු ලැබේ. යම් අයදුම්කරුවකු කාණ්ඩ අංක 02 ක් හෝ 03 ක් යටතේ ඉහළම සම ලකුණු වාර්තාකර ඇති විට, කාණ්ඩය තෝරා ගැනීමේ දී ඔහු/ඇය ගේ කැමැත්ත සලකා බලනු ලැබේ. එහිදී එක් එක් කාණ්ඩය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉහළ ම සහතිකයට සමාන ලකුණු හිමි වන්නේ නම්, කාණ්ඩ අංක 01, 02, 03 යන අනුපිළිවෙලට පිළිවෙලින් ප්‍රමුඛතාවය හිමි වන පරිදි අයදුම්කරුවන් කාණ්ඩ ගත කරනු ලැබේ.

(iv) පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික) - අධ්‍යාපන අමාත්‍යාංශය / ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මඟින් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගී විය හැකි අන්තර්ජාතික තරග වන දකුණු ආසියානු, ආසියානු, පොදුරාජ්‍ය මණ්ඩලීය, ලෝක ශූරතා, ඔලිම්පික් තරගවල යොවුන්, කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ කාණ්ඩවල තරග මේ සඳහා වලංගු වේ. (පාසල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලික ව සහභාගීවන අන්තර්ජාතික තරග සලකා බලනු නොලැබේ.)

**තව ද අන්තර්ජාතික තරග සහතික සලකා බලනු ලබන්නේ අවම වශයෙන් අදාළ ක්‍රීඩාව සඳහා ජාතික මට්ටමේ තරගාවලියකින් (මෙම *ගැසට්* නිවේදනයේ 4.19.5 (v) හි දැක්වෙන) ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා ඇත්නම් පමණි. එසේ නොමැති අවස්ථාවල ලකුණු ලබා දෙනු නොලැබේ. අන්තර්ජාතික මට්ටමේ තරග සඳහා සහභාගීවීම හෝ සහතිකපත් සඳහා ලකුණු ලබා දීම සඳහා අදාළ ජාතික කණ්ඩායම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය හා තෝරාගත් බවට ජාතික සංගමයෙන් ලබා දුන් ලිපිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.**

(v) පිළිගත් ක්‍රීඩා තරග (දේශීය) - අධ්‍යාපන අමාත්‍යාංශය/ ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග ද,

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග ද,

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික්ක මට්ටමේ/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ක්‍රීඩා තරඟ/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරඟ හා අධ්‍යාපන කොට්ඨාස මට්ටමේ ක්‍රීඩා තරඟ ද, මේ සඳහා වලංගු වේ.

(vi) ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද 'ඒ' කාණ්ඩයේ තරගවල 1, 2 හා 3 වැනි ස්ථානවලට පමණක් එම තරගාවලි යටතේ අනුපිළිවෙලින් ප්‍රමුඛතාව දෙනු ලැබේ.

(vii) 2023 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත අයදුම් කරනු ලබන්නන් සඳහා 2019.01.01 දින සිට 2023.12.31 දින දක්වා ලබා ගත් ක්‍රීඩා ජයග්‍රහණ සහතිකපත් ද, 2024 අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත අයදුම් කරනු ලබන්නන් සඳහා 2020.01.01 දින සිට 2024.12.31 දින දක්වා ලබා ගත් ක්‍රීඩා ජයග්‍රහණ සහතිකපත් ද, මේ සඳහා වලංගු වේ.

(*සැලකිය යුතුයි* :- මෙම කාලසීමාවට පෙර හා පසුව නිකුත් කළ සහතිකපත් ලකුණු ලබාදීම සඳහා සලකා බලනු නො ලබන අතර ඉදිරිපත් කරනු ලබන සියලු සහතික අදාළ ආයතන මඟින් තහවුරු කර ගනු ලැබේ.)

(viii) එම කාලසීමාවට අයත්, අයදුම්කරුගේ උපරිම දක්ෂතාව දක්වා ඇති ක්‍රීඩා ජයග්‍රහණ සහතිකපත් තුනකට පමණක් ලකුණු ප්‍රදානය කරනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණ දිනයේ දී අදාළ සියලු ම සහතිකපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(ix) එහි දී ලකුණු හිමි වනුයේ, එක් ඉසව්වක දී එකම වසරක ලබා ගත් සහතිකපත්වලින් ඉහළ ම සහතිකයට පමණි.

(x) සහතිකපත්වලට ලකුණු ලබාදීමේ දී සලකා බලනු ලබන ක්‍රීඩා අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිගත් ජාතික හා පාසල් සංගම්වලට අයත් ක්‍රීඩා පහත දක්වා ඇත.

| *බැඩ්මින්ටන්* | *ටයිකොන්ඩෝ* | *මල්ලව පොර* | *දැල්පන්දු* |
|---|---|---|---|
| ජල ක්‍රීඩා (පිහිනුම්) | ත්‍රෝ බෝල් | පැසිපන්දු | වුෂූ |
| ජූඩෝ | රග්බි පාපන්දු | සැහැල්ලු පන්දු ක්‍රිකට් | ටෙනිස් |
| පාපැදි | බර ඉසිලීම | අත්පන්දු | බොක්සිං |
| එල්ලේ | පාපන්දු | මලල ක්‍රීඩා | කබඩි |
| හොකී | ජිම්නාස්ටික් | ක්‍රිකට් | බේස්බෝල් |
| කරාතේ දෝ | මේසපන්දු | වොලිබෝල් | ශාරීරික අභ්‍යාස |
| චෙස් | කැරම් | | |

**සැලකිය යුතු යි :-**

I. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී අවම ලකුණු 40 ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

II. අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී අංක 1, 2 හා 3 කාණ්ඩ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාව හිමි වේ.

III. තෝරා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා සමස්ථ ක්‍රීඩා ලකුණු 10ට වඩා වැඩි විය යුතුය. පූරප්පාඩු

පැවැතිය ද ක්‍රීඩා ලකුණු 10 හෝ ඊට අඩු වේ නම් ඔහු / ඇය තෝරා ගැනීමට නුසුදුස්සකු වේ.

IV. පාසල් ක්‍රීඩා සංගම් හෝ ජාතික ක්‍රීඩා සංගම් මඟින් පවත්වනු ලබන තරගාවලි විවිධ මට්ටම් අනුව පැවැත්වුව ද, ඒ ඒ තරග සඳහා සංවිධානය කරනු ලබන ඉහළම මට්ටමේ තරගාවලිවලදී ලබා දෙන සහතිකපත් සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සිදු කෙරේ.

**පාඨමාලා අංකය 31 .- ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය (සිංහල)**
**32 - ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය (දෙමළ)**

4.20

4.20.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළු ව විෂයන් තුනකින් (03) එකවර සමත් වීම

*හා*

4.20.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී විද්‍යාව විෂයයට සාමාන්‍ය සාමර්ථයක් සහිත ව සමත් වීම.

**පාඨමාලා අංකය 33 - කෘෂිකර්ම තාක්ෂණවේදය (සිංහල)**
**34 - කෘෂිකර්ම තාක්ෂණවේදය (දෙමළ)**

4.21

4.21.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව යටතේ කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයන් තුන (03) එකවර සමත් වීම;

*හෝ*

4.21.2 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂය තුන (03) එකවර සමත් වීම;

*හෝ*

4.21.3 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී කලා විෂය ධාරාව යටතේ කෘෂි විද්‍යාව/ කෘෂි තාක්ෂණවේදය/ ජෛව සම්පත් තාක්ෂණවේදය/ ආහාර තාක්ෂණවේදය යන එක් විෂයයක් සහිත ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.21.4. 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී විද්‍යාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හා කෘෂි හා ආහාර තාක්ෂණය / ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය යන විෂයයන් දෙකෙන් එකකට සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

*සැලකිය යුතු යි :-*

- පාඨමාලාවට බඳවාගනු ලබන සංඛ්‍යාවෙන් 50% ක් 4.21.1 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25% ක් 4.21.2 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද, ඉතිරි 25% ක ප්‍රමාණය 4.21.3 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද වන සේ තෝරාගනු ලැබේ.
- යම් විෂය කාණ්ඩයක් යටතේ ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම්, 4.21.1, 4.21.2, 4.21.3 හි සඳහන් සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව ලැබෙන පරිදි ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරනු ලැබේ.

**පාඨමාලා අංකය 35 - නිර්මාණකරණය හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය (සිංහල)**
**36 - නිර්මාණකරණය හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය (දෙමළ)**

4.22

4.22.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.22.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ශිල්ප කලා විෂයයට සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

**පාඨමාලා අංකය 37 - නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය (සිංහල)**
**40 - නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය (දෙමළ)**

4.23

4.23.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා තෙවන විෂයය ලෙස අනුමත විෂයයන්ගෙන් එක් විෂයයක් ඇතුළු ව විෂය තුනකින් (03) එකවර සමත් වීම,

*හෝ*

4.23.2 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ද්‍රෂ්‍ඩ තාක්ෂණවේදයට අයත් සිවිල් තාක්ෂණවේදය, යාන්ත්‍රික තාක්ෂණවේදය, විදුලිය ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය යන විෂයයන්ගෙන් එක් විෂයයක් ඇතුළු ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.23.3 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිතව අ.පො.ස.( සා.පෙළ) විභාගය සමත් වීම.

***සැලකිය යුතු යි :-***

**අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය, නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය, නිර්මාණකරණය විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය යන විෂයයන්ගෙන් එකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.**

**ඉතා විශේෂයි :**

(i) එක් එක් පාඨමාලා සඳහා 4.23.1 හෝ 4.23.2 සුදුසුකම් සහිත ව අයදුම් කළ අයදුම්කරුවන් ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගනු ලබන සංඛ්‍යාව පහත සඳහන් අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ.

4.23.4 තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල,

(අ) 4.23.1, 4.23.3 සුදුසුකම් සහිත අයදුම්කරුවන්,

(ආ) 4.23.2, 4.23.3 සුදුසුකම් සහිත අයදුම්කරුවන්

| පාඨමාලා අංකය | 43 - | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි) |
|---|---|---|

4.24

4.24.1

4.24.1.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.24.1.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් /ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම;

*හෝ*

4.24.2

4.24.2.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.24.2.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් /ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම;

*හෝ*

4.24.3

4.24.3.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී භෞතිය විද්‍යා විෂය ධාරාවෙන් විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.24.3.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සමත් වීම.

4.24.3.3. 12 ශ්‍රේණියේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) සමත් උක්ත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙලට යටත් ව මෙම කාණ්ඩයේ තෝරා ගැනීම්වල දී ප්‍රමුඛතාව හිමි වේ.

*හෝ*

4.24.4

4.24.4.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාවෙන් විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.24.4.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් /ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.24.4.3 12 වන ශ්‍රේණියේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය විභාගය (GIT) සමත් උක්ත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙලට යටත් ව මෙම කාණ්ඩයේ තෝරා ගැනීම්වල දී ප්‍රමඛතාව හිමි වේ.

*හෝ*

4.24.5.

4.24.5.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී කලා, වාණිජ්‍ය, තාක්ෂණවේදය හා 'වෙනත්' යන ඕනෑම විෂය ධාරාවක් යටතේ ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.24.5.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට විශිෂ්ට සාමර්ථායක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.24.5.3 12 වන ශ්‍රේණියේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය විභාගය (GIT) සමත් උක්ත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ඔවුන්ගේ Z අගයේ අනුපිළිවෙලට යටත්ව මෙම කාණ්ඩයේ තෝරා ගැනීම්වල දී ප්‍රමුඛතාව හිමි වේ.

4.24.6 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අදාළව මෙම පාඨමාලාවට ඉල්ලුම් කරනු ලබන වතු සේවකයන්ගේ දරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ හා පාඨමාලාව පවත්වනු ලබන්නේ රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී ය.

***සැලකිය යුතු යි :-***

බඳවා ගැනීමට නියමිත අයදුම්කරුවන් ප්‍රමාණය ඔවුන්ගේ Z අගය අනුපිළිවෙලට පහත සඳහන් ක්‍රමවේදයට සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ඒ අනුව,

I. 4.24.1 යටතේ එම සුදුසුකම් සහිතව අයදුම් කර ඇති අයදුම්කරුවන්,

II. පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී 4.24.1 යටතේ ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ නම් 4.24.2 යටතේ ඉල්ලුම් කර ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්,

III. පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවූ අයදුම්කරුවන් සංඛ්‍යාව තවදුරටත් ප්‍රමාණවත් නොවේ නම්, ඒ සඳහා 4.24.3, 4.24.4 හා 4.24.5 කාණ්ඩවලට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව ලැබෙන පරිදි සුදුසුකම් සහිත අයදුම්කරුවන්,

4.24.7 තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල

(i) Z අගයේ අනුපිළිවෙල අනුව 4.24.1 යටතේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්,

(ii) Z අගයේ අනුපිළිවෙල අනුව 4.24.2 යටතේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්,

(iii) සෑම විෂය ධාරාවක ම සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) සමතුන්ට ඒ ඒ කාණ්ඩයේ අයදුම්කරුවන් අතර ප්‍රමුඛතාව ලැබෙන පරිදි Z අගයේ අනුපිළිවෙල අනුව 4.24.3, 4.24.4, 4.24.5 යටතේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මෙම කාණ්ඩ ප්‍රමුඛතා අනුපිළිවෙලට යටත් ව තෝරා ගනු ලැබේ.

**පාඨමාලා අංකය 44 .- දෙවන බස (සිංහල)**

4.25

4.25.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.25.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම;

*හා*

4.25.3 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (දෙමළ) උසස් පාඨමාලාව හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වෛකල්පිත දෙමළ භාෂාව විෂයය හෝ සමත් වීම.

*සැලකිය යුතු යි :-*

- මෙම පාඨමාලාවට බඳවා ගැනීම අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (දෙමළ) උසස් පාඨමාලාව හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වෛකල්පිත දෙමළ භාෂාව විෂයය හෝ සමත් අයදුම්කරුවන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව හිමි වන පරිදි Z අගයේ අනුපිළිවලට සිදු කෙරේ.

- මෙම පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ දිවයිනේ ඕනෑම දිස්ත්‍රික්කයක දෙමළ මාධ්‍ය පාසලක සේවය කිරීමට එකඟ වන්නේ නම් පමණි.

**පාඨමාලා අංකය 45 - දෙවන බස (දෙමළ)**

4.26

4.26.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව විෂය තුනකින් (03) එකවර සමත් වීම ;

*හා*

4.26.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම ;

*හා*

4.26.3 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වෛකල්පිත සිංහල භාෂාව විෂයය හෝ සමත් වීම.

*සැලකිය යුතු යි :-*

- මෙම පාඨමාලාවට බඳවා ගැනීම අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වෛකල්පිත සිංහල භාෂාව විෂයය හෝ සමත් අයදුම්කරුවන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව හිමිවන පරිදි Z අගයේ අනුපිළිවෙලට සිදු කෙරේ.

- මෙම පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ දිවයිනේ ඕනෑම දිස්ත්‍රික්කයක සිංහල මාධ්‍ය පාසලක සේවය කිරීමට එකඟ වන්නේ නම් පමණි.

| | | |
|---|---|---|
| **පාඨමාලා අංකය 46** | **.-** | **විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය (සිංහල)** |
| **47** | **-** | **විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය (දෙමළ)** |

4.27

4.27.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.27.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

***සැලකිය යුතු යි :-***

මෙම පාඨමාලාවට තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පාඨමාලාවෙන් පසුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශ්‍රවණ, දෘෂ්ටි, බුද්ධිමය ඌනතා, ඔටිසම්, ඉගෙනුම් දුෂ්කරතා, බහුවිධ දුබලතා සහිත සිසුන් සඳහාවන ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දෙනු ඇත. එබැවින් ඉහත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සිටින ඒකකවල අනිවාර්යයෙන් සේවය කිරීමට එකඟවන බවට ගිවිසුමකට එළඹීමට කැමති අයදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතු වේ. (අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛ අංක 42/2012 හා අධ්‍යාපන ලේකම්වරයා ගේ අංක ඊඩී/9/18/8/2/6 හා 2017.05.17 දිනැති ලිපිය අනුව වේ.)

| | | |
|---|---|---|
| **පාඨමාලා අංකය 48** | **-** | **ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව (සිංහල)** |
| **49** | **-** | **ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව (දෙමළ)** |

4.28

4.28.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව යන වාණිජ්‍ය විෂය ධාරාවට අයත් විෂයයන් තුන (03) හෝ එයින් විෂයයන් 02 ක් සමඟ තුන්වන විෂයය වශයෙන් පහත සඳහන් කර ඇති එක් විෂයයක් සමඟ විෂය තුනකින් (03) එකවර සමත් වීම;

- ව්‍යාපාර සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය, ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හෝ ගණිතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, භෞතික විද්‍යාව

*හා*

4.28.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය හෝ ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

| | |
|---|---|
| **පාඨමාලා අංකය 50 .-** | **ඉස්ලාම් ධර්මය (සිංහල)** |

4.29

4.29.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය , ඉස්ලාම් ශිෂ්ඨාචාරය හා අරාබි යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.29.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව සමත් වීම;

*ඇතුළුව*

4.29.3 අල්-ආලිම් විභාගය (ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන්ගෙන් හා අවසාන විභාගයේ සියලුම විෂයයන්ගෙන් යන දෙකෙන්ම) සමත් වීම;

*හෝ*

4.29.4 අල්-ආලිම් ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන් ගෙන් සමත් වීම;

*හා*

4.29.5 මෞලවි සහතිකය ලබා තිබීම.

4.29.6 තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල

(*අ*) 4.29.1, 4.29.2, 4.29.3 සහ 4.29.5 සහතික හිමි අයදුම්කරුවන්

(*ආ*) 4.29.1, 4.29.2, 4.29.4 සහ 4.29.5 සහතික හිමි අයදුම්කරුවන්

(*ඉ*) 4.29.1, 4.29.2 සහ 4.29.5 සහතික හිමි අයදුම්කරුවන්

(*ඊ*) 4.29.1 සහ 4.29.2 සහතික හිමි අයදුම්කරුවන්

| | | |
|---|---|---|
| **පාඨමාලා අංකය 51** | **-** | **මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය (සිංහල)** |
| **52** | **-** | **මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය (දෙමළ)** |

4.30

4.30.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට ඕනෑම විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.30.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාව (සිංහල/දෙමළ) හා ගණිතය යන විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථය සහිතව සමත් වීම.

***සැලකිය යුතු යි :-***

**පාසලේදී බාලදක්ෂ, බාලදක්ෂිකා, ශිෂ්‍ය භට, රතු කුරුස, සෞඛ්‍යදාන, පරිසර නියමුහට වැනි කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යෙදුනු අපේක්ෂකයින්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. ඒ බව සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතු වෙයි.**

අයදුම්කරුවන් අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ලබා ඇති Z අගයේ කුසලතාව අනුව දිස්ත්‍රික්ක පදනමින් හා ජාතික පදනමින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, තෝරා ගැනීම සිදු කරනුයේ අයදුම්කරුවන් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලබා ඇති Z අගය ද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලබාගන්නා ප්‍රවීණතා ලකුණු ද ඒ සමඟ ගලපා සකස් කරනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ය. ප්‍රවීණතා ලකුණු සැකසීමේ දී කණ්ඩායම් ක්‍රියාකාරකම් හි යෙදී ඇති මට්ටම අනුව ලකුණු ලබා දෙනු ඇත. දිස්ත්‍රික් පදනමෙන් තෝරාගැනීම් අවසන් වූ පසු ජාතික පදනමින් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කෙරේ. ඒ අනුව ඉහළ Z අගයක් සහ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලබාගන්නා ඉහල ප්‍රවීණතා ලකුණු ද සැලකිල්ලට ගෙන සකස් කරනු ලබන පුමුඛතා ලේඛනය පදනම් කරගෙන තෝරා ගැනීම සිදු වේ.

මෙම පාඨමාලාවට තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පාඨමාලාවෙන් පසුව පාසල්වල ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දෙනු ඇත. එබැවින් උපදේශනය හා මාර්ගෝපදේශනය ගුරුවරුන් ලෙස අනිවාර්යයෙන් සේවය කිරීමට එකඟවන බවට ගිවිසුමකට එළඹීමට කැමති අයදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතු වේ.

| පාඨමාලා අංකය | 52 - සමාජයීය විද්‍යාව (ඉංග්‍රීසි) |
|---|---|

4.31

4.31.1 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඉතිහාසය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් හෝ සහිතව කලා විෂය ධාරාවට අයත් විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හෝ*

4.31.2 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී ආර්ථික විද්‍යාව විෂයය සහිත ව වාණිජ්‍ය විෂය ධාරාවේ විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හෝ*

4.31.3 2023 හෝ 2024 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී භූගෝල විද්‍යාව විෂයය සහිත ව 'වෙනත්' විෂය ධාරාවේ විෂය තුනකින් (03) එකවර සමත් වීම;

*හා*

4.31.4 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉතිහාසය / පුරවැසි අධ්‍යාපනය / භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට හෝ අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිත ව සමත් වීම.

4.31.5 මෙම පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන මුළු සංඛ්‍යාවෙන් 60% ක ප්‍රතිශතයක් 4.31.1 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද, 30% ක ප්‍රතිශතයක් 4.31.2 යටතේ අයදුම් කර ඇති අයදුම්කරුවන්ගෙන් ද, 10% ක ප්‍රතිශතයක් 4.31.3 යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගෙන් ද වනසේ සුදුසුකම් අනුපිළිවෙලට තෝරාගනු ලැබේ. යම් විෂය ධාරාවක් යටතේ ප්‍රමාණවත් සුදුසුකම්ලාභීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී 4.31.1, 4.31.2, 4.31.3 හි සඳහන් සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛතාව ලැබෙන පරිදි ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

**5.0 පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පහත වගුවේ දැක්වේ.**

*සැලකිය යුතු යි :-*

- මාර්ගගත ක්‍රමවේදය (Online System) ඔස්සේ අයදුම් කිරීමේ දී අදාළ තොරතුරු නිසි පරිදි භාවිතා කළ යුතු වේ. කෙසේ වෙතත් ඕනෑම පාඨමාලාවක් විද්‍යාපීඨ තුළ යෝග්‍ය පරිදි ස්ථානගත කිරීම පිළිබඳ අවසන් තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම්වරයා සතු වේ.
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්කිරීමේ දී එක් එක් පාඨමාලාවට එහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ඔස්සේ හිමි පාඨමාලා අංකය මෙම වගුවේ I - තීරුවේ සඳහන් පරිදි නිවැරදිව ඇතුළත් කිරීම අනිවාර්යය වේ.

  වගුවේ සඳහන් තීරු පහත සඳහන් පරිදි නම් කර ඇත.

  I තීරුව - පාඨමාලාවේ අංකය
  II තීරුව - පාඨමාලාවේ නම
  III තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
  IV තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
  V තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

| *පාඨමාලා අංකය* | *පාඨමාලාවේ නම* | *මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ* | | |
|---|---|---|---|---|
| | | *සිංහල මාධ්‍යය* | *දෙමළ මාධ්‍යය* | *ඉංග්‍රීසි මාධ්‍යය* |
| *I* | *II* | *III* | *IV* | *V* |
| 01<br><br><br>02 | ප්‍රාථමික අධ්‍යාපන (සිංහල)<br><br><br>ප්‍රාථමික අධ්‍යාපන (දෙමළ) | ඌව<br>නිල්වලා<br>මහවැලි<br>සාරිපුත්ත (දඹදෙණිය)<br>සියනෑ<br>ශ්‍රීපාද<br>පස්දුන්රට<br>පුලතිසිපුර<br>වයඹ<br>රුවන්පුර<br>රුහුණ<br>හාපිටිගම්<br>මහරගම | වවුනියා<br>ශ්‍රීපාද<br>අඩ්ඩාලච්චේන<br>අඩ්ඩාලච්චේන ගුරු විද්‍යාලය<br>මඩකලපුව<br>යාපනය<br>දර්ගා නගර් | |
| 03<br><br>04<br><br>05 | විද්‍යාව (සිංහල)<br><br>විද්‍යාව (දෙමළ)<br><br>විද්‍යාව (ඉංග්‍රීසි) | <br><br>නිල්වලා<br>සියනෑ<br><br>පුලතිසිපුර<br>ශ්‍රීපාද | වවුනියා<br><br>ශ්‍රීපාද<br>අඩ්ඩාලච්චේන<br><br>අඩ්ඩාලච්චේන ගුරු විද්‍යාලය<br>මඩකලපුව<br>යාපනය | <br><br>නිල්වලා<br>සියනෑ<br><br>යාපනය |
| 06<br>07<br>08 | ගණිතය (සිංහල)<br>ගණිතය(දෙමළ)<br>ගණිතය(ඉංග්‍රීසි) | නිල්වලා<br>පස්දුන්රට<br>සියනෑ<br>ශ්‍රී පාද | වවුනියා<br>මඩකලපුව<br>ශ්‍රීපාද<br>අඩ්ඩාලච්චේන<br>අඩ්ඩාලච්චේන ගුරු විද්‍යාලය<br>යාපනය | නිල්වලා<br>සියනෑ<br>යාපනය |

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| *I* | *II* | *III* | *IV* | *V* |
| 09<br>10 | සමාජයීය විද්‍යාව (සිංහල)<br>සමාජයීය විද්‍යාව (දෙමළ) | රුහුණ<br>ශ්‍රීපාද | ශ්‍රීපාද<br>මඩකලපුව<br>දර්ගා නගර් | |
| 11 | බුද්ධ ධර්මය | සාරිපුත්ත<br>(නිට්ටඹුව හා දඹදෙණිය) | | |
| 12 | හින්දු ධර්මය | | වවුනියා | |
| 13 | ඉස්ලාම් ධර්මය (දෙමළ) | | අඩ්ඩාලච්චේන | |
| 14<br>15 | කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය (සිංහල)<br>කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය (දෙමළ) | වයඹ | වවුනියා | |
| 16 | සිංහල භාෂාව හා සාහිත්‍යය | වයඹ<br>පේරාදෙණිය<br>හාපිටිගම්<br>මහවැලි<br>වවුනියා | | |
| 17 | දෙමළ භාෂාව හා සාහිත්‍යය | | ශ්‍රීපාද<br>දර්ගා නගර්<br>මඩකලපුව<br>පේරාදෙණිය | |
| 18 | ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය | | | මහවැලි<br>පස්දුන්රට<br>යාපනය<br>පේරාදෙණිය<br>මහරගම<br>රුහුණ<br>රුවන්පුර<br>අඩ්ඩාලච්චේන ගුරු විද්‍යාලය |
| 19<br>20 | චිත්‍ර (සිංහල)<br>චිත්‍ර (දෙමළ) | මහවැලි<br>වයඹ<br>හාපිටිගම් | ශ්‍රීපාද<br>මඩකලපුව<br>යාපනය ගුරු විද්‍යාලය | |
| 21 | නැටුම් (පෙරදිග) | මහවැලි<br>වයඹ<br>හාපිටිගම් | | |
| 22 | නැටුම් (භරත) | | ශ්‍රීපාද<br>යාපනය | |
| 23 | සංගීතය (පෙරදිග) | මහවැලි<br>වයඹ<br>හාපිටිගම් | | |

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| I | II | III | IV | V |
| 24 | සංගීතය (කර්ණාටක) | | ශ්‍රීපාද<br>යාපනය | |
| 25 | බටහිර සංගීතය (ඉංග්‍රීසි) | | | මහරගම |
| 26<br>27 | නාට්‍ය හා රංගකලාව (සිංහල)<br>නාට්‍ය හා රංගකලාව (දෙමළ) | <br>මහවැලි | මඩකලපුව | |
| 28<br>29<br>30 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (සිංහල)<br>සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (දෙමළ)<br>සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (ඉංග්‍රීසි) | ඌව<br>නිල්වලා<br>හාපිටිගම්<br>රුහුණ | වවුනියා<br>මඩකලපුව<br>යාපනය | ඌව |
| 31<br>32 | ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය (සිංහල)<br>ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය (දෙමළ) | රුහුණ | වවුනියා<br>දර්ගා නගර් | |
| 33<br>34 | කෘෂිකර්ම තාක්ෂණවේදය (සිංහල)<br>කෘෂිකර්ම තාක්ෂණවේදය (දෙමළ) | පුලතිසිපුර | වවුනියා | |
| 35<br>36 | නිර්මාණකරණය හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය (සිංහල)<br>නිර්මාණකරණය හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය (දෙමළ) | සියනෑ | මඩකලපුව | |
| 37<br>40 | නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය (සිංහල)<br>නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය (දෙමළ) | සියනෑ | මඩකලපුව | |
| 43 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි) | | | රුවන්පුර<br>පස්දුන්රට<br>මහරගම<br>යාපනය<br>දර්ගා නගර් |
| 44 | දෙවන බස (සිංහල) | මහවැලි<br>වයඹ<br>මහරගම<br>වවුනියා | | |
| 45 | දෙවන බස (දෙමළ) | | මහවැලි<br>වවුනියා | |
| 46<br>47 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය (සිංහල)<br>විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය (දෙමළ) | හාපිටිගම්<br>මහරගම | අඩ්ඩාලච්චේන<br>යාපනය | |

| *පාඨමාලා අංකය* | *පාඨමාලාවේ නම* | *මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ* | | |
|---|---|---|---|---|
| | | *සිංහල මාධ්‍යය* | *දෙමළ මාධ්‍යය* | *ඉංග්‍රීසි මාධ්‍යය* |
| *I* | *II* | *III* | *IV* | *V* |
| 48 | ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව (සිංහල) | මහරගම | අඩ්ඩාලච්චේන | |
| 49 | ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව (දෙමළ) | | | |
| 50 | ඉස්ලාම් (සිංහල) | අඩ්ඩාලච්චේන | | |
| 51 | වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය (සිංහල) | පස්දුන්රට | යාපනය | |
| 52 | වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය (දෙමළ) | වයඹ | | |
| 53 | සමාජ විද්‍යාව (ඉංග්‍රීසි) | | | රුහුණ |

***සැලකිය යුතුයි :-***

- දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගා නගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙන් කර ඇත්තේ කාන්තාවන් සඳහා පමණි.

**6.0 2025 වර්ෂය සඳහා ශික්ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය**

6.1 තෝරා ගැනීමේ පදනම :

6.1.1 2023 හෝ 2024 වර්ෂයේ දී අ.පො.ස.(උ.පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා 2028 සහ 2029 වර්ෂවල ගුරුභවතුන් විශ්‍රාම යාම නිසා පාසල් පද්ධතියේ ඇති වන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව සහ මේවන විට ද පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව හා දුෂ්කර ප්‍රදේශවල විෂය විවිධත්වය ඇති කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද සලකා බලා විෂය මට්ටමින් ගුරු අවශ්‍යතාව ගණනය කර එම සංඛ්‍යාව 2025 වර්ෂයේ දී ශික්ෂණලාභීන් සඳහා එක් එක් පාඨමාලාවට විද්‍යාපීඨ තුළ එකවර පහසුකම් සපයා දිය හැකි සංඛ්‍යාව සමග ගලපා බඳවා ගනු ලබන ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

- බඳවා ගනු ලබන සංඛ්‍යාව සඳහා බලපානු ලබන ප්‍රධානතම සාධකය වන්නේ එක් එක් පාඨමාලාව සඳහා විද්‍යාපීඨවල පහසුකම් සපයා දිය හැකි සංඛ්‍යාවයි.

6.1.1.1 ඒ අනුව 2023 හෝ 2024 වර්ෂයේ දී අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත 2025 වර්ෂයේ බඳවාගැනීම් පහත සඳහන් පරිදි සිදු කෙරේ.

(i) පාඨමාලා මාධ්‍ය තෝරා ගැනීමේ දී *ගැසට්* නිවේදනයේ 5.0හි දැක්වෙන වගුවේ සඳහන් එක්, එක් පාඨමාලා පැවැත්වෙන මාධ්‍ය පිළිබඳව හා ඒ සඳහා අවශ්‍ය වන සුදුසුකම් පිළිබඳව වඩාත් පැහැදිළි අවබෝධයක් ලබා ගනිමින් අයදුම් කළ යුතු වේ.

(ii) බඳවා ගැනීමට නියමිත සමස්ත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් ජාතික පදනමින් ද ඉතිරි 50% දිස්ත්‍රික් පදනමින් ද බඳවා ගනු ලැබේ. ජාතික හා දිස්ත්‍රික් පදනම් සඳහා පුරප්පාඩු වෙන් කිරීමේ දී ජාතික පදනමට ප්‍රමුඛතාව දෙනු ලැබේ.

(iii) *ගැසට්* නිවේදනයේ දක්වා ඇති පරිදි යම් පාඨමාලාවකට (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව හැර) අදාළ මාධ්‍යයෙන් අදාළ දිස්ත්‍රික්කවලින් බඳවා ගනු ලබන බවට දන්වා ඇති සංඛ්‍යාව, දිස්ත්‍රික්ක පදනම යටතේ අයදුම්කරුවන් ලබා ඇති Z අගයේ අනුපිළිවෙල සමග *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සෙසු සුදුසුකම් ද නිසි පරිදි සම්බන්ධ කරමින්,

4.0 හි 'සැලකිය යුතුය' යන ඡේදයේ සහ අදාළ පාඨමාලා යටතේ දක්වා ඇති ක්‍රමවේදයන්ට අනුකූලව බඳවා ගනු ලැබේ. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව සඳහා එක් එක් දිස්ත්‍රික්කයෙන්, අදාළ මාධ්‍යයෙන් බඳවා ගනු ලබන සංඛ්‍යාව, අයදුම්කරුවන්ගේ ක්‍රීඩා ලකුණු අනුපිළිවෙල අනුව 4.0 ඡේදයේ හා අදාළ පාඨමාලාව යටතේ දක්වා ඇති පරිදි සිදු කෙරේ.

(iv) දිස්ත්‍රික් පදනමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ජාතික මට්ටමේ පුරප්පාඩු සඳහා තෝරා ගැනීම සිදු කරනු ලැබේ. එහිදී ඉතිරි අයදුම්කරුවන් අතුරින් දිවයිනේ ඉහළම Z අගයේ අනුපිළිවෙල සමඟ *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සෙසු සුදුසුකම් ද නිසි පරිදි සම්බන්ධ කරමින් 4.0 හි සැලකිය යුතුයි යන ඡේදයේ සහ අදාළ පාඨමාලාව යටතේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූලව බඳවා ගනු ලැබේ. ශාරීරික අධ්‍යාපනය සඳහා බඳවා ගනු ලබන්නේ දිස්ත්‍රික් මට්ටමින් බඳවා ගැනීමෙන් අනතුරුව ඉතිරිවන අයදුම්කරුවන්ගෙන් දිවයිනේම ක්‍රීඩා ලකුණු අනුපිළිවෙල 4.0 ඡේදයේ හා අදාළ පාඨමාලාව යටතේ දක්වා ඇති පරිදිය.

(v) පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් පදනමේ පුරප්පාඩුවක් ඇති වුවහොත් ජාතික පදනමට තේරී ඇති අයදුම්කරුවන්ගෙන් එම දිස්ත්‍රික්කයේ සුදුසුකම් අනුපිළිවෙල හා මනාපය අනුව දිස්ත්‍රික් පුරප්පාඩුව සම්පූර්ණ කෙරේ. එහිදී ජාතික මට්ටමේ පුරප්පාඩුවක් ඇතිවුවහොත් එම පුරප්පාඩුව ජාතික මට්ටමෙන් සම්පූර්ණ කරනු ලැබේ.

(vi) ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට එක් එක් පාඨමාලා සඳහා අදාළ මාධ්‍යයෙන් වැවිලි දිස්ත්‍රික්කවලින් බඳවා ගනු ලබන බවට *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සංඛ්‍යාව, ඊට බලපැවැත්වෙන විශේෂ කොන්දේසිවලට යටත් ව අයදුම්කරුවන් ලබා ඇති Z අගයේ අනුපිළිවෙල හා සෙසු සුදුසුකම් ද නිසි පරිදි සම්බන්ධ කරමින්, 4.0 හි 'සැලකිය යුතුය' යන ඡේදයේ දක්වා ඇති ක්‍රමවේදයන්ට අනුකූලව තෝරාගනු ලැබේ.

6.1.2 Z ලකුණු කුසලතාව මත පදනම්ව තෝරා ගන්නා පාඨමාලාවල දී අදාළ දිස්ත්‍රික්කයේ හෝ ජාතික පදනමේ එක ම Z අගයක් ලබා ගෙන ඇති සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයකු තෝරා ගැනීමට සිදුවන විටක දී / ක්‍රීඩා කුසලතා සඳහා එක සමාන ලකුණක් සහිත සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයකු තෝරා ගැනීමට සිදුවන විටක දී පළමුවරට අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී 3.0 හි 3.5 යටතේ සඳහන් කර ඇති හර (ප්‍රධාන) විෂය හයට (06) ලබා ගත් ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ.

ඒ අනුව අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵලවල විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 4ක් ද, අධි සම්මාන සාමාර්ථයකට ලකුණු 3ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 2ක් ද, සාමාන්‍ය සාමාර්ථයට ලකුණු 1ක් ද බැගින් ලකුණු ප්‍රදානය කොට එම සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

6.1.3 ශාරීරික අධ්‍යාපනය, නැටුම් (පෙරදිග), නැටුම් (භරත), සංගීතය (පෙරදිග), සංගීතය (කර්ණාටක), නාට්‍ය හා රංගකලාව සහ බටහිර සංගීතය පාඨමාලා සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී පාඨමාලාවට බඳවා ගනු ලබන විෂයයට අදාළ ව විෂය ප්‍රවීණතාව සනාථ කළ යුතු ය.

6.1.4 දිස්ත්‍රික්ක පදනමින් තෝරා ගැනීමේ දී යම් පාඨමාලාවක් සඳහා යම් දිස්ත්‍රික්කයක් යටතේවන සමස්ත දත්තපාදකය තුළ ම සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නො සිටින අවස්ථාවක, එම දිස්ත්‍රික්කය අයත් වන පළාත යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අදාළ කුසලතා අනුපිළිවෙල ද, එය ද ප්‍රමාණවත් නොවේ නම් ජාතික මට්ටමේ කුසලතා අනුපිළිවෙල ද සලකා බලමින් එම පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ.

6.2 **ස්ථිර පදිංචිය නිර්ණය :**

6.2.1 අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය/ පළාත පහත සඳහන් ක්‍රමවේදය අනුව නිර්ණය කරනු ලැබේ.

6.2.1.1 දිස්ත්‍රික්ක පදනමින් බඳවා ගැනීමේ දී අයදුම්කරු ඉල්ලුම් කරනු ලබන දිස්ත්‍රික්කය වන්නේ ඔහු/ ඇය පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වර්ෂ දෙකෙ හි ස්ථිර ව පදිංචි ව සිටි දිස්ත්‍රික්කය යි.

6.2.1.2 මෙහි දී අයදුම්කරු පළමුවරට හෝ ඊට පසු වතාවක අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත්, අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචියෙන් බැහැරව පිහිටි දිස්ත්‍රික්කය/ පෞද්ගලික පහසුව තකා අදාළ කාලසීමාව තුළ තාවකාලික ව පදිංචි ව සිටි දිස්ත්‍රික්කය/ වර්තමානය වන විට පදිංචිය වෙනත් දිස්ත්‍රික්කයකට මාරු කර ඇත්නම් එම දිස්ත්‍රික්කය අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ලෙස සලකනු නොලබන බව අවධාරණය කරනු ලැබේ.

6.2.1.3 පළාත් කුසලතාව සලකා බැලීමේ දී අයදුම්කරු පළමුවරට අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වර්ෂ දෙකෙහි ඔහු/ ඇය ස්ථිර ව පදිංචි ව සිටි පළාත අයදුම් කරනු ලබන පළාත සේ සලකනු ලැබේ.

6.2.2 සෑම අයදුම්කරුවකු ම තම ස්ථිර පදිංචිය පහත සඳහන් ක්‍රමවේදයට යටත් ව සනාථ කළ යුතු වේ.

***සැලකිය යුතු යි :-***

- ඡන්ද හිමි නාමලේඛනවල දත්ත සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත අන්තර්ජාලය හරහා පරීක්ෂා කිරීමට නියමිත බැවින් කිසිදු අයදුම්කරුවකු අයදුම් කරන අවස්ථාවේ දී ඊට අදාළ කිසිදු ලේඛනයක් ඉදිරිපත් නොකළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පහත දැක්වෙන පරිදි අදාළ සනාථ කිරීම් සිදු කල යුතු වේ.

I. බඳවා ගැනීමේ පදනමට අදාළ ව, අයැදුම්කරුවන් විසින් තම ස්ථිර පදිංචිය ඡන්ද හිමි නාම ලේඛන දත්ත මගින් සනාථ කළ යුතු වේ.

II. අයදුම්කරුගේ වයස සම්පූර්ණ නොවීම නිසා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට නොහැකි වූ අදාළ වර්ෂයන් සඳහා දෙමාපියන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාමලේඛන දත්ත මගින් ස්ථිර පදිංචිය සනාථ කළ යුතු වේ.

III. යම් හෙයකින් දෙමාපියන් හැර වෙනත් භාරකරුවකු යටතේ අදාළ කාලසීමාවේ ස්ථිර ව පදිංචි වී සිටි අයැදුම්කරුවන් එම භාරකාරත්වය අදාළ කාලසීමාව ද සමගින් ග්‍රාම සේවක විසින් නිකුත් කරනු ලබන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS – 04) - ‘වෙනත් කරුණු’ තීරය යටතේ සඳහන් කර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී සනාථ කළ යුතු වේ. එහි දී අයදුම්කරුගේ ඡන්දය නොමැති වර්ෂ සඳහා භාරකරුගේ ඡන්ද හිමි නාමලේඛන දත්ත මගින් පදිංචිය සනාථ කළ යුතු වේ.

IV. කවර හෝ හේතුවක් මත නියමිත වසර තුනට (03) හෝ ඉන් කිහිපයකට අදාළ ව ඡන්ද ලියාපදිංචි නොකිරීම හේතුවෙන් ඡන්ද හිමි නාමලේඛන දත්ත මගින් පදිංචිය සනාථ කිරීමට නොහැකි අවස්ථාවල දී ඡන්දය ලියාපදිංචි කිරීම සිදු කළ නො හැකි වීමට අදාළ පිළිගත හැකි හේතු ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS-04) ‘වෙනත් කරුණු’ යටතේ එම කාල සීමාව තුළ ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී අත්සනින් සනාථ කළ යුතු වේ.

V. ඡන්දය ලියාපදිංචි නොකිරීම හේතුවෙන් වසර එකකට හෝ දෙකකට අදාළ ව පමණක් ඡන්ද හිමි නාමලේඛන දත්ත පවතින අවස්ථාවල දී ඉතිරි වසර සඳහා පිළිගත හැකි වෙනත් ලේඛනවලින් පදිංචිය සනාථ කළ යුතු වේ. (උදා;- ග්‍රාම නිලධාරී සහතිකය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පතෙහි ලිපිනය)

VI. යම් හෙයකින් වර්ෂ තුන (03) සඳහා ම නොව එක් වර්ෂයක් සඳහා පමණක්

වුව අයදුම්කරු ලියාපදිංචි වී ඇත්නම්, ඉතිරි වර්ෂයන් සඳහා දෙමාපියන්ගේ / භාරකරුගේ ඡන්දය කවර දිස්ත්‍රික්කයකට ලියාපදිංචි වී තිබුණ ද අයදුම්කරුගේ ඡන්ද ලියාපදිංචියට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

**6.3 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම :**

6.3.1 බඳවා ගන්නා සංඛ්‍යාවෙන් 75% ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද , 25% ක් සිංහල ජන වර්ග අයදුම්කරුවන්ගෙන් ද වන සේ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී ඉන්දියානු ද්‍රවිඩ සම්භවය පිළිබඳව සෘජු ව හෝ වක්‍ර ව හෝ සනාථ කිරීමට අයදුම්කරුවන් හට හැකි විය යුතු අතර, තම උප්පැන්න සහතිකයේ පියාගේ/ මවගේ ජාතිය 'ඉන්දියානු දෙමළ' යනුවෙන් සඳහන් විය යුතු වේ.)

6.3.2 වැවිලි දිස්ත්‍රික්කවල පවත්නා පුරප්පාඩුවල ප්‍රමාණාත්මකභාවය අනුව බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව එම දිස්ත්‍රික්කවලට වෙන් කෙරේ.

6.3.3 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුර, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල, කුරුණෑගල සහ කොළඹ යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන් පමණි.

6.3.4 මේ වනවිට වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන් හා මේ වනවිටත් වතුවල පදිංචි, වැවිලි අංශයේ වසර 10 ක් සේවය කිරීමෙන් පසුව,

2014 – 2023 (2023 අ.පො.ස.(උ.පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා)

2015 – 2024 (2024 අ.පො.ස.(උ.පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා)
යන කාලසීමාව අතරතුර කාලයේ දී විශ්‍රාම ගිය, අසනීප හේතුවෙන් සේවයෙන් ඉවත් වූ හෝ මරණයට පත් වූ හෝ අයගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

6.3.5. ඉහත 6.3.4 වගන්තිය යටතේ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් දැනට වතු අංශයේ සේවය නොකළ ද, පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වතු සේවක දරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ.

6.3.5.1 2023 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) සමත් අයදුම්කරුවන්ට අදාළව 2013 හෝ ඊට පසු වර්ෂවල හෝ වතු සේවයේ අවම වශයෙන් වසර 05 ක්, 04 ක්, 03 ක් අඛණ්ඩ ව සේවය කළ අයගේ දරුවන් පිළිබඳ ව පිළිවෙළින් සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමිවන්නේ 2022, 2021, 2020 ආදී වශයෙන් අනුපිළිවෙළිනි.)

6.3.5.2 2024 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) සමත් අයදුම්කරුවන්ට අදාළව 2014 හෝ ඊට පසු වර්ෂවල හෝ වතු සේවයේ අවම වශයෙන් වසර 05 ක්, 04 ක්, 03 ක් අඛණ්ඩ ව සේවය කළ අයගේ දරුවන් පිළිබඳ ව පිළිවෙළින් සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමිවන්නේ 2023, 2022, 2021 ආදී වශයෙන් අනුපිළිවෙළිනි.)

6.3.6. යම් දෙමළ මාධ්‍ය පාඨමාලාවකට ඉහත අයදුම්කරුවන් අතුරින් ද සුදුසුකම් ලබන ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් ඉහත දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් ඉන්දියානු ද්‍රවිඩ සම්භවයක් සහිත අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ.

6.3.7. ඒ අනුව ද ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු ද්‍රවිඩ සම්භවයක් සහිත දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ.

6.3.8.

6.3.8.1 සිංහල මාධ්‍ය පාඨමාලාවලට වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවකයන්ගේ දරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ ශ්‍රීපාද/වෙනත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල එම පාඨමාලාවලට අයදුම්කර ඇති අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ Z අගය හා සෙසු අදාළ සුදුසුකම් අනුපිළිවෙළ පදනම් කර ගනිමිනි.

6.3.8.2 දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා 6.3.4 – 6.3.7 අනුව සුදුසුකම්ලාභී අයදුම්කරුවන්

ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පාඨමාලා සඳහා ද්විඩ මාධ්‍ය සම්මුඛ පරීක්‍ෂණ පවත්වනු ලබන සෙසු විද්‍යාපීඨ හරහා දත්ත පාදකයේ රැඳී සිටින සුදුසුකම්ලාභීන් අනුපිළිවෙළ අතරින් එම පුරප්පාඩු පුරවනු ලැබේ.

6.3.9 සම්මුඛ පරීක්ෂණයේ දී රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන අතරින් තමාට අදාළ ලේඛන ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- දැනට වතු අංශයේ සේවයේ නියුතුවන්නන් වැවිලි අංශයේ සේවයේ නියුතු ව සිටින බව (අදාළ කාලවකවානුව සහිත ව) හා වතුවල ස්ථිර පදිංචිව සිටින බවට වතු අධිකාරි විසින් සහතික කළ ලිපිය,

- වසර දහයක (10) සේවා කාලයකින් පසුව,

  2014 - 2023 (2023 අ.පො.ස.(උ. පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා) 2015 – 2024 (2024 අ.පො.ස.(උ. පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා) කාලසීමාව අතරතුර, අසනීප තත්ත්වයක් හේතුවෙන් වතු සේවයෙන් ඉවත් වී හෝ විශ්‍රාම ගොස් ඇති හෝ මරණයට පත් වී ඇති හෝ සේවකයන්ගේ පවුල්වල සාමාජිකයන් මේ වන විටත් වතුවල ස්ථිරව පදිංචිව සිටින බවට අදාළ පදිංචිය සහ සේවයෙන් ඉවත් වූ/ විශ්‍රාම ගිය වර්ෂය හා දිනය පැහැදිලි ව සනාථ කරමින් වතු අධිකාරීවරයා විසින් නිකුත් කළ ලිපිය හා ග්‍රාම සේවක සහතිකය,

- වතු සේවයේ යෙදී සිට,

  2014 හෝ ඊට පසු වර්ෂයක දී (2023 අ.පො.ස.(උ.පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා) සහ 2015 හෝ ඊට පසු වර්ෂයක දී (2024 අ.පො.ස.(උ.පෙළ) සමත් අයදුම්කරුවන් සඳහා) හෝ විශ්‍රාම ගොස් ඇති/ වතු සේවයෙන් ඉවත් වී ඇති සේවකයන් තමන් අදාළ වසර පහක් (05) හෝ ඊට වැඩි කාලයක් හෝ අඛණ්ඩ ව සේවයේ නියුතු ව සිටි බව සනාථ කරමින් විශ්‍රාම ගිය/ වතු සේවයෙන් ඉවත් වූ වර්ෂය හා දිනය පැහැදිලි ව සඳහන් කර ඇති වතු අධිකාරීවරයා විසින් නිකුත් කළ ලිපිය,

- සේවක අර්ථසාධක අරමුදලට අයකිරීම් සිදු කරන බව/ සිදු කරන ලද බව ලියාපදිංචි අංක සහිත ව සනාථ කරන ලිපිය/ ලිපි හා වතුවල පදිංචිය සනාථ කරමින් ග්‍රාමසේවක විසින් ලබා දෙන ග්‍රාමසේවක සහතිකය.

6.3.10 අයදුම්කරුවන් පාඨමාලාවෙන් පසු ව වතු අංශයේ පාසල්වල අඛණ්ඩව වසර දහයක් (10) සේවය කරන බවට පොරොන්දු වන දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු වේ.

6.3.11 සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු ද්විඩ සම්භවයක් ඇති අයදුම්කරුවකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන් ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවකු නම් සිංහල මාධ්‍ය ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ.

6.3.12 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ක්‍රියාත්මකවන පාඨමාලා සඳහා අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් හට සුදුසුකම් අනුව තමාට අදාළ මාධ්‍යයෙන් අනෙකුත් පීඨවල ක්‍රියාත්මකවන පාඨමාලා සඳහා ද අයදුම් කළ හැකි ය.

**7.0 තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු :**

7.1. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලා සඳහා යෝග්‍යතාව සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය. නියමිත දින කිසිදු දැනුම් දීමකින් තොරව සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවන ඒ ඒ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන් වෙනුවට අදාළ දිස්ත්‍රික්කයෙන් සුදුසුකම් අනුපිළිවෙළට වෙනත් අයදුම්කරුවන් කැඳවනු ලබන අතර, නො පැමිණි අයදුම්කරුවන් පිළිබඳ නැවත සලකා බලනු නොලැබේ.

7.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යවන අතර, එදිනට මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් පිළිබඳ ව තෝරා ගැනීම්වල දී සලකා බලනු නො ලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමට ළඟා වීමට මෙන් ම ගුරුවෘත්තියට පිවිසීමට ද අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික හා මානසික යෝග්‍යතාව, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දෙන නිර්ණායකයන් ඔස්සේ පළමු සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්‍ෂා කර බලනු ලැබේ. එහි දී පාඨමාලාව හැදෑරීමට සහ ගුරුවෘත්තියට පිවිසීමට අයදුම්කරු සතු කායික, මානසික යෝග්‍යතාව ප්‍රමාණවත් ද යන්න පිළිබඳ ව ඔවුන් තම නිර්දේශය ඉදිරිපත් කරනු ලැබේ.

7.4 ඉහත 7.3 ඡෙදය ප්‍රකාරව යෝග්‍යතාව සහිත එමෙන් ම බඳවා ගැනීමේ නිර්ණායක යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දැනුම් දෙනු ඇත. එම අයදුම්කරුවන් ලියාපදිංචිය සිදුකිරීමට පෙර අයදුම් කිරීමේ දී ඉදිරිපත් කර ඇති දත්තවල නිරවද්‍යතාවය නැවත පරීක්ෂා කරනු ලබන අතර, ඒ අනුව සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් පමණක් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නියමිත පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලැබේ. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට රාජකාරී දින දහයක් (10) ඇතුළත ලියාපදිංචි නොවුනහොත් ඇතුල්වීමේ අවස්ථාව ඔහුට / ඇයට අහිමි වනු ඇත. ඒ අනුව ඇති වන පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ පදනම යටතේ නියමිත දත්ත පාදකයේ සඳහන් අයදුම්කරුවන් අදාළ කුසලතා අනුපිළිවෙළට සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගනු ලැබේ.

7.4.1 එබැවින් නියමිත කාලසීමාව තුළ ලියාපදිංචි නොවන අයදුම්කරුවන් විසින් පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳ කිසිසේත් ම සලකා බැලීමට අවස්ථාව නොමැති බව සැලකිය යුතු වේ.

- ඉහත අංක 7.3 හෝ 7.4 හෝ යටතේ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී නිර්දේශ ලබා දීමට නො හැකි මට්ටමේ යම් සුවිශේෂී ගැටලු තත්ත්වයන් නිරීක්‍ෂණය වුවහොත් පමණක් අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ කමිටුවකට යොමු කෙරේ. එම වාර්තාව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයට/ අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

7.5. පළමු හා දෙවන සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමෙන් අනතුරුව විද්‍යාපීඨයේ ලියාපදිංචිය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර තම සෞඛ්‍ය තත්ත්වය සනාථ කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6. ඕනෑ ම අයදුම්කරුවකුට තම කැමැත්තේ අනුපිළිවෙළ අනුව, පාඨමාලා තුනකට අයදුම් කළ හැකි ය. නමුත්, කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් ලබන පාඨමාලා සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පාඨමාලා එකකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා තේරී පත්වීමට සුදුසුකම් ලබා ඇති විටක අයදුම්කරුගේ පාඨමාලා කැමැත්තේ අනුපිළිවෙළට ප්‍රමුඛතාව දෙමින් එක් පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබේ.

7.7 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක යම් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරු ව යම් හෙයකින් තවත් පාඨමාලාවකට පසුකාලීනව තේරී පත් වුවහොත් ඒ අනුව පළමු පාඨමාලාව හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනස් කිරීමට අවසර දෙනු නො ලැබේ. එසේ ම යම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක කවර හෝ පාඨමාලාවකට ලියාපදිංචි වීමෙන් අනතුරු ව වෙනත් පෞද්ගලික හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, පාඨමාලාව, පාඨමාලා මාධ්‍යය වෙනස් කිරීමට කිසිසේත් ම අවසර දෙනු නො ලැබේ.

7.8 කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශික්ෂණලාභීන් සංඛ්‍යාවක් යම් විද්‍යාපීඨයක නොමැති අවස්ථාවක අදාළ පාඨමාලාව ක්‍රියාත්මක වන ළඟම ඇති විද්‍යාපීඨයකට මාරු කරනු ලැබේ.

7.9 ප්‍රමාණවත් ගුරු අවශ්‍යතාවක් නො පවතින පාඨමාලා අහෝසි කිරීම, බඳවා ගන්නා ශික්‍ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කිරීම හා එක් එක් පාඨමාලා ආයතන තුළ ස්ථානගත කිරීම පිළිබඳ අවසාන තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය /අධ්‍යාපන ලේකම්වරයා සතු ය.

**8.0 පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට හෝ නුසුදුස්සන් :**

8.1. දැනටමත් රජයේ හෝ රජයේ ආධාර ලබන උපකෘත පාසල්වල හෝ රජයේ ලියාපදිංචි පිරිවෙන්වල හෝ අනුමත වෙනත් විද්‍යායතනවල හෝ ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2. රජයේ පාසලක ගුරු පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,

8.3. මේ වන විටත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරමින් සිටින හෝ හදාරමින් සිට හැර ගිය හෝ හදාරා අවසන් කළ හෝ අය,

8.4. රජයේ විශ්ව විද්‍යාලයක / රජයේ විශ්ව විද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම්වලින් බඳවා ගනු ලබන උපාධි / ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා 'රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද' යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී සිටින/ හදාරමින් සිටින/උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය, (දැනට ඉහත ආයතනයක මෙම ඡේදයේ සඳහන් පාඨමාලාවකට ලියාපදිංචි වී සිටින සිසුන් *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කර ගත්ත ද, ඔවුහු අයදුම් කිරීමට/ ඇතුළත් වීමට සුදුසුකම් නො ලබති. තව ද *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ද/ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී, එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද ඇතුළත් වීමට සුදුසුකම් නො ලබති.)

*සැලකිය යුතු යි :-*

මාර්ගගත ක්‍රමය ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටීම ද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ අයදුම් කිරීමට නුසුදුස්සකු වීමට හේතු වේ.

8.5 විනයානුකූල හේතූන් මත හෝ වෙනත් හේතූන් මත හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ශිෂ්‍යභාවය අවලංගු කරනු ලැබූ අය.

8.6 විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අයදුම්කරුවන්.

**9.0 පාඨමාලාව සඳහා අදාළ කොන්දේසි:**

9.1 පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්ත ව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී පවත්වනු ලබන අවසන් බාහිර පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90%ක ට නො අඩු වීම අනිවාර්ය වේ.

9.2 සෑම ශික්ෂණලාභියකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ ඇගයීම් හා අභ්‍යන්තර පරීක්ෂණවලින් හා අවසන් බාහිර විභාගයෙන් ද සමත් විය යුතු ය. එමෙන් ම ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා හදාරන අය හැර අනෙක් සියලු ම පාඨමාලා හදාරන අය ඉහත විභාගවල දී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතු ය.

9.3 ශික්ෂණලාභියකුට නේවාසික ව අධ්‍යයන කටයුතුවල යෙදෙන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස දහයක් (10) සඳහා මාසයකට රු.8,000/- ක වටිනාකමින් යුත් ආහාරපාන ද, නේවාසික පහසුකම් ද සපයනු ලැබේ. සීමාවාසී වර්ෂය තුළ දී මාස දහයක් (10) සඳහා මාසයකට රු 8,000/- බැගින් වන දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතු ය.

9.4 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ලියාපදිංචිවන අයදුම්කරුවන් පාඨමාලාවට වැයවන මුදල සහ වෙනත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග රු. ලක්ෂ අටක (රු. 800,000.00) ඇප බැඳුම්කරයකට සහ ගිවිසුමකට අත්සන් කළ යුතු ය. අයදුම්කරු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වූ දින සිට කැලැන්ඩර දින හැටක් (60) ඇතුළත පාඨමාලාව අත්හරින්නේ නම් ශික්ෂණලාභියා වෙනුවෙන් දරන ලද වියදම රජයට ආපසු ගෙවා ඉවත් විය හැක. අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වූ දින සිට කැලැන්ඩර දින හැටකින් (60) පසුව ඉවත් වනවිට මෙම ඇප බැඳුම්කරයේ සහ ගිවිසුමෙ හි සම්පූර්ණ මුදල (රු. 800,000.00) රජයට ගෙවිය යුතු වේ. තව ද යම් අයදුම්කරුවකු කිසිදු විධිමත් දැනුම්දීමකින් තොර ව මාසයකට නොඅඩු කාලයක් පාඨමාලාවේ අධ්‍යයන කටයුතුවලට සහභාගී නොවන්නේ නම්, ඔහු/ ඇය පාඨමාලාව අතහැර ගියා සේ සලකා ඇප බැඳුම්කරයේ හා ගිවිසුමේ සඳහන් මුළු මුදලවන රු. 800,000.00 රජයට අයකර ගැනීමෙන් පසු ව පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

පාඨමාලාව සාර්ථක ව සම්පූර්ණ කිරීමෙන් පසුව රජයේ පාසලකට ලබා දෙනු ලබන ගුරුපත්වීම භාර නොගන්නේ නම්, ඇප බැඳුම්කරයේ හා ගිවිසුමේ සඳහන් මුළු මුදල (රු.800,000.00) රජයට ගෙවිය යුතු වේ. තව ද පාඨමාලාව සාර්ථක ව සම්පූර්ණ කිරීමෙන් පසුව රජයේ පාසලකට ලබා දෙනු ලබන ගුරුපත්වීම ලබා ගැනීමෙන් අනතුරු ව වසර පහක් (05) රජයට සේවය නොකරන අයකු, සේවය කිරීමට වසර පහෙන් ඉතිරි ව ඇති කාලයට (මාස වශයෙන් ගණනය කර) අදාළ මුදල ගෙවිය යුතු වේ.

එම මුදල ගණනය වනුයේ මෙලෙසිනි.

$$\frac{\text{රු. } 800{,}000.00}{\text{මාස } 60} \times \text{සම්පූර්ණ කිරීමට ඉතිරි ව ඇති මාස ගණන}$$

9.4.1 සුවිශේෂී වෛද්‍ය හේතූන් මත පාඨමාලා කාලසීමාව තුළ දී එම පාඨමාලාව අත හැර යන්නේ නම් පහත සඳහන් ලිපි ලේඛන මගින් රෝගයේ සැබෑ ස්වරූපය සනාථ කළ යුතු ය.

- රෝගී තත්ත්වය සඳහා ප්‍රතිකාර ලැබීම්වලට අදාළ ව පිළිගත හැකි වෛද්‍ය වාර්තා.

- තවදුරටත් අධ්‍යයන කටයුතු සිදුකර ගෙන යාමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයක් නොමැති බවට රජයේ වෛද්‍යවරයකු විසින් සනාථ කරන ලද ලිපිය.

අදාළ ලේඛන පිළිබඳ සලකා බලමින්, විද්‍යාපීඨයේ කළමනාකරණ කමිටුව විසින් නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යොමු කරනු ලබන රජයේ රෝහලක වෛද්‍යවරයෙකුගේ හෝ වෛද්‍ය මණ්ඩලයක හෝ නිර්දේශ ලබා ගෙන, ඒ සඳහා අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ/ අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරු ව, අය කිරීමකින් තොරව පාඨමාලාවෙන් ඉවත් වීමට අවසර ලබා දෙනු ලැබේ.

9.4.2 නීත්‍යානුකූල ව පාඨමාලාවෙන් ඉවත්වීමකින් තොර ව මිස, පාඨමාලාවේ කාලසීමාව තුළ හෝ ස්ථිර ගුරු පත්වීම් ලබා දීම දක්වාවන කාලය අතරතුර හෝ විදේශගත වීම සඳහා කිසිදු ශික්ෂණලාභියකුට අවසර ලබා දෙනු නො ලැබේ.

9.5 පාඨමාලාව අතරතුර විනයානුකූල හේතු මත හෝ බඳවා ගැනීම් කටයුතු සඳහා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම මත හෝ 8.0 ඡේදයේ සඳහන් අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන් යන ඡේදයට අදාළ ව සැබෑ තොරතුරු වසන් කිරීම මත හෝ පාඨමාලාවෙන් නෙරපා හැරීමට සිදුවන අවස්ථාවක දී ගිවිසුම හා ඇප බැඳුම්කරයේ සම්පූර්ණ මුදල (රු.800,000.00) අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

9.6 පාඨමාලාව පැවැත්වෙන කාලසීමාව තුළ දී ශික්ෂණලාභියාට 8.4 ඡේදයේ දැක්වෙන ආකාරයේ පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත්ම අවසර දෙනු නො ලැබේ. එසේ පාඨමාලාවක නිරත වන බව සනාථ වුවහොත් ශික්ෂණලාභියා අත්සන් තබන ඇප බැඳුම්කරය සහ ගිවිසුමේ මුළු වටිනාකම (රු. 800,000.00) අයකර ගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.7 *ගැසට්* නිවේදනයේ 8.4 ඡේදයේ දැක්වෙන සුදුසුකම් හා කොන්දේසිවලට යටත් ව වෙනත් කවර හෝ රජයේ උසස් අධ්‍යාපන ආයතනයක වෘත්තීය පුහුණු පාඨමාලාවක් / ඩිප්ලෝමා හෝ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති / හදාරමින් සිටින අයදුම්කරුවන්, විද්‍යාපීඨ ප්‍රවේශය සඳහා තේරී පත් වුවහොත්, ඒ සඳහා ලියාපදිංචිවන දිනයේ දී ඉහත කී ආයතනයක තමන් විසින් ලියාපදිංචි වී ඇති / හදාරමින් සිටින පාඨමාලාවෙන් *ගැසට්* නිවේදනය නිකුත් කිරීමට පෙර දිනක දී විධිමත් පරිදි ඉවත් වී ඇති බවට සනාථ කරන ලිපි ලේඛන විද්‍යාපීඨය වෙත භාර දීම අනිවාර්යයවන අතර, ඒ සඳහා අසමත්වන අයදුම්කරුවන් විද්‍යාපීඨය තුළ ලියාපදිංචි කරනු නො ලැබේ.

9.8 පාඨමාලා කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විවාහය ලියාපදිංචි කළ හොත් හෝ අයදුම්කරන විට/ විද්‍යාපීඨ ලියාපදිංචියට පෙර විවාහය ලියාපදිංචි කර ඇති බව / දික්කසාද වී ඇති බව සනාථ වුවහොත් ශිෂ්‍යභාවය අවලංගු කරනු ලැබේ. විවාහ වී ඇති බව හෙළි වීමෙන් පසු ව විවිධ හේතු දක්වමින් පාඨමාලා කාලය තුළ දික්කසාද වන අයට නැවත ශිෂ්‍යභාවය ලබා දීමක් සිදු නො කෙරේ.

9.9 විශේෂ ප්‍රතිපාදන යටතේ බඳවා ගන්නා පූජ්‍ය / පූජක පක්ෂය ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව අතරතුර උපැවිදි වුවහොත් ගිවිසුම හා ඇප බැඳුම්කරය අනුව, සම්පූර්ණ මුදල (රු.800,000.00) අය කරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. පාඨමාලාව අවසන් වීමෙන් පසු සෑම ආගමකට ම අයත් පූජ්‍ය/පූජක පක්ෂය උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු පහක් (05) අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමග ඇප බැඳුම්කරයකට සහ ගිවිසුමකට එළඹිය යුතු යි. යම් හෙයකින් අදාළ වසර පහ (05) සම්පූර්ණ කිරීමට පෙර උපැවිදි වුව හොත්, ඉතිරි කාලය සඳහා (මාස වශයෙන් ගණනය කර) ඇප බැඳුම්කරය සහ ගිවිසුම අනුව අදාළ මුදල ගණනය කර, එම මුදල රජයට ගෙවිය යුතු වේ.

එම මුදල ගණනය වනුයේ $\dfrac{\text{රු. } 800{,}000.00}{\text{මාස } 60}$ x සම්පූර්ණ කිරීමට ඉතිරි ව ඇති මාස ගණන

මෙලෙසිනි.

*සැලකිය යුතු යි :-*

- මෙහි දී, පරිවාස කාලය තුළ දී උපැවිදි වුවහොත් අදාළ මුදල අයකර ගෙන, සේවයෙන් ඉවත් කරනු ලැබේ.

9.10 පාඨමාලා කාලසීමාව තුළ අපේක්ෂිත හැසිරීම, පැමිණීම, උද්යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන (විෂය සමගාමී කටයුතු ද ඇතුළු ව) ශික්ෂණලාභියකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේ ම ආයතනික පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අසමත් වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ/ අධ්‍යාපන ලේකම්වරයා ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.11 පාඨමාලා කාලසීමාව තුළ දී ශික්ෂණලාභියාගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයට/ අධ්‍යාපන ලේකම්වරයාට ඉදිරිපත් කර අවසාන තීරණය ලබා දෙනු ඇත.

9.12 පාඨමාලා කාලසීමාව තුළ දී, විද්‍යාපීඨ විනය නීතිරීති මාලාවට පටහැනිව යම් ක්‍රියාවක නිරත වූ බව සනාථ වුවහොත් ඒ සම්බන්ධව විද්‍යාපීඨ විනය මණ්ඩලයේ නිර්දේශ ද අනුව යම් කාලසීමාවකට පංති තහනම් කිරීම/ පාඨමාලා කාලය දීර්ඝ කිරීම/ පාඨමාලාවෙන් ඉවත් කිරීම/ වෙනත් සුදුසු දඬුවමකට යටත් කිරීමේ බලය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම්වරයා සතු ය.

9.13 පාඨමාලාව හදාරනු ලබන කාලසීමාව තුළ අදාළ ශික්ෂණලාභීන්ට කුමන හෝ වෙනත් පාඨමාලාවක් හැදෑරීම සඳහා සතියේ දිනවල දී/ සති අන්ත දිනවල දී ආයතනයෙන් බැහැර යාමට කිසිසේත් ම අවසර දෙනු නො ලැබේ.

9.14 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් මුල් වසර පහ තුළ ගුරු සේවයේ යෙදී සිටිය දී, කවර හේතුවක් මත හෝ සේවයෙන් ඉවත් වන්නේ නම් හෝ සේවයෙන් ඉවත් වී විදේශ ගත වන්නේ නම් හෝ අදාළ ඇප බැඳුම්කරය හා ගිවිසුම අනුව මුළු වටිනාකමෙන් (රු 800,000.00 න්) ඉතිරි ව ඇති කාලය සඳහා අයවිය යුතු මුදල (මාස වශයෙන් ගණනය කර) රජයට ගෙවිය යුතු වේ.

එම මුදල ගණනය වනුයේ,

$$\frac{\text{රු. } 800{,}000.00}{\text{මාස } 60} \times \text{සම්පූර්ණ කිරීමට ඉතිරි ව ඇති මාස ගණන}$$

ලෙසිනි

*සැලකිය යුතු යි :-*

- මුල් වර්ෂ පහ තුළ 9.14 ඡේදයේ සඳහන් පරිදි සේවයෙන් ඉවත් වුවහොත් නැවත ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරියකු ලෙස ගුරු වෘත්තියට පිවිසීමට අවස්ථාව ලබා දෙනු නො ලැබේ.

- රජයේ පාසලක මුල් පත්වීමේ දින සිට වසර පහක (05) සක්‍රිය සේවා කාලය සම්පූර්ණ නොකරන ලද කල් හි එම ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතා අදාළ විස්තරාත්මක ඩිප්ලෝමා සහතිකය ඉල්ලුම් කිරීමට හිමිකම් නො ලබයි.

- ගුරු සේවයේ මුල් වසර පහ සම්පූර්ණ නො කළ, පරිවාස කාලයට යටත් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන්ට අධ්‍යාපන ලේකම්රයාගේ 24/2017 චක්‍රලේඛය ප්‍රකාරව සහ *ගැසට්* නිවේදනය, ගිවිසුම, ඇප බැඳුම්කරය, ආයතන සංග්‍රහයේ නීතිරීති හා රෙගුලාසි ද, අදාළ කාලසීමාවේ බලපැවැත්වෙන නීතිරීති ද වලංගුවන පරිදි අධ්‍යයන කටයුතු සඳහා පමණක් වැටුප් රහිත නිවාඩු ලබමින් විදේශ ගත විය හැකි ය.

- ගුරු සේවයේ මුල් වසර පහ සම්පූර්ණ නොකළ, නමුත් සේවයේ ස්ථිර කරන ලද ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන්ට අධ්‍යාපන ලේකම්වරයාගේ 24/2017 චක්‍රලේඛය ප්‍රකාරව සහ *ගැසට්* නිවේදනය, ගිවිසුම, ඇප බැඳුම්කරය, ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16 වගන්තිය හා අදාළ කාලසීමාවේ බලපැවැත්වෙන නීතිරීති ද වලංගුවන පරිදි අධ්‍යයන කටයුතු/රැකියා කටයුතු සඳහා වැටුප් රහිත නිවාඩු ලබමින් විදේශ ගත විය හැකි ය.

9.15 පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ සංවර්ධනය (අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු විෂය සමගාමී කටයුතු ඇතුළු) පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.16 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හිමි කර ගත් ශික්ෂණලාභීන්ට රජයේ පාසල්වලට ගුරු පත්වීම් ලබා දෙනු ලැබේ. ඔවුන් දිස්ත්‍රික්ක/ පළාත්/ ජාතික පදනමින් බඳවා ගත්ත ද, ස්ථානගත කිරීමේ දී අදාළ දිස්ත්‍රික්කයේ/ අදාළ පළාතේ පුරප්පාඩු නොමැති

නම්, දිවයිනේ ඕනෑ ම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතුය. (දෙවන බස - සිංහල/ දෙමළ පාඨමාලා සඳහා පාඨමාලා අංක 44 සහ 45 යටතේ දක්වා ඇති කොන්දේසි අදාළ වේ.) ස්ථානගත කිරීමේ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිසමේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතියට යටත්ව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම්වරයා සතුය.

9.16.1 පාඨමාලා සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලබන අයදුම්කරුවන් ඉහත කොන්දේසිවලට එකඟ වන්නේ නම් පමණක් එම සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් විය යුතු වේ.

9.16.2 ඉහත කොන්දේසි යටතේ පාඨමාලාව හදාරනු ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන් ම තමා හදාරනු ලබන පාඨමාලාවට අදාළ විෂයය ඉගැන්වීමෙ හි නිරත විය යුතු ය. තව ද ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, දිස්ත්‍රික්/ පළාත්/ජාතික පදනමින් බඳවා ගන්නා අයදුම්කරුවන් මුල් පත්වීම ලබන, තමන් ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයේ/ ස්ථිර පදිංචි පළාතේ හෝ ජාතික පදනම යටතේ නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ හෝ මුල් පත්වීම ලබන කවර හෝ දිස්ත්‍රික්කයේ/ පළාතේ මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර පහක් (05) සේවය කිරීම අනිවාර්ය සේවා කොන්දේසියක් ලෙස සලකා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග ඇප බැඳුම්කරයකට සහ ගිවිසුමකට බැඳිය යුතු ය.

9.17 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෛද්‍ය/ පෞද්ගලික හේතු මත වෙනස් කර ගැනීමට යම් ශික්ෂණලාභියකු උත්සාහ දරන්නේ නම් ඔහු/ ඇය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් නො ලබයි.

9.18 බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධ ව අදාළ නිලධාරින්ට ශික්ෂණලාභියා විසින් හෝ ඔහුට / ඇයට සම්බන්ධ වෙන යම් පාර්ශ්වයක් විසින් හෝ අයුතු බලපෑම් සිදු කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

9.19 අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරනු ලබන පාඨමාලාවලට අදාළව සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම් කිරීමේ අවසාන දිනට (2025.11.28) හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.

9.20 යම් විද්‍යාපීඨයක කවර හෝ පාඨමාලාවකට අදාළ මාධ්‍යයෙන්, අදාළ දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට දිස්ත්‍රික්ක/ පළාත්/ ජාතික කුසලතා අනුපිළිවෙළින් සුදුසුකම්ලාභීන් ප්‍රමාණවත් නොවන්නේ නම් එම විද්‍යාපීඨයේ ක්‍රියාත්මක වන සෙසු පාඨමාලා අතුරින් අධ්‍යාපන පද්ධතියේ පවතින වැඩිම ගුරු අවශ්‍යතා සහිත පාඨමාලාවලට ප්‍රමුඛතාව ලැබෙන පරිදි ඒ, ඒ පාඨමාලා යටතේ ජාතික පදනමින් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (*ගැසට්* නිවේදනයේ 'ප්‍රාථමික අධ්‍යාපනය පාඨමාලාව යටතේ "සැලකිය යුතු යි" හි iv සහ 6.3 - 'ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරාගැනීම' යටතේ 6.3.8 හි දක්වා ඇති කොන්දේසිවලට එම පාඨමාලා යටතේ පළමුව අවස්ථාව ලබා දෙනු ලැබේ.)

9.21 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ පිළිබඳව අවධානයෙන් සිටීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම බඳවාගැනීමට හිමිකමක් නොවන බව ද අවබෝධ කරගත යුතු වෙයි.

9.22 මෙම පාඨමාලා සකස්කර ඇත්තේ මේ වනවිට පාසල්වල ක්‍රියාත්මකවන විෂයමාලාවට අනුකූලව වේ. ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළව සිදුවන වෙනස්කම් අනුව මෙම පාඨමාලාවන් ද වෙනස්වීමට ඉඩ ඇති අතර, ඊට අනුරූපව ගලපන පාඨමාලා හැදෑරීමට තෝරාගන්නා ශික්ෂණලාභීන් එකඟ විය යුතුය.

**10.0 අයදුම් කිරීම සඳහා උපදෙස් :**

- *ගැසට්* නිවේදනයේ 14.0 ට අදාළව 14.1 - 14.8 වගුවල සඳහන් පරිදි එක් එක් පාඨමාලාවට බඳවා ගනු ලබන සංඛ්‍යාව පිළිබඳව ඉතා පැහැදිලි අවබෝධයක් ලබා ගෙන ඒ අනුව අයදුම් කළ යුතු වේ.

10.1 **ඉතා විශේෂයි :**

10.1.1 සියලුම අයදුම්කරුවන් අයදුම් කිරීම සිදු කළ යුත්තේ මාර්ගගත ක්‍රමවේදය (Online System) ඔස්සේ පමණි.

**සැලකිය යුතු යි :- ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු නොකළ යුතු වේ.**

10.1.2 මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදු කළ යුතු වේ. ඒ අනුව අදාළ මාර්ගගත වැඩසටහනට පිවිසීම සඳහා පහත සඳහන් සබැඳිය ඔස්සේ මාර්ගගත වැඩසටහනට පිවිස අදාළ පියවර අනුගමනය කරමින් ඔබගේ අයදුම් කිරීම සිදු කළ යුතු වේ.

https://ncoe.moe.gov.lk/NCOE

10.2 ඉහත 10.1.1 අනුව අයදුම්පත සම්පූර්ණ කර යොමු කළ (submit) පසු, යම් සංශෝධනයක් සිදුකළ යුතු නම් ඒ සඳහා දින 7ක කාලයක් ලබා දෙනු ලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් උපදෙස් ඉතා හොඳින් කියවා ඉතා නිවැරදි දත්ත ලබා දීමේ පූර්ණ වගකීම අයදුම්කරු සතු වේ. විශේෂයෙන් ම ඉල්ලුම් කරන පාඨමාලා පිළිබඳ තොරතුරු හෝ වෙනත් සංශෝධන සිදු කිරීම සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලබන බව ද සැලකිය යුතු වේ.

10.3 *ගැසට්* නිවේදනයේ දක්වා ඇති කොන්දේසි, සුදුසුකම් හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, සෑම අයදුම්කරුවකුට ම උපරිම වශයෙන් පාඨමාලා තුනක් (03) සඳහා ඉල්ලුම් කල හැකිය.

10.4 එකම පාඨමාලාවකට මාධ්‍ය දෙකකින් අයදුම් කලහොත් එය පාඨමාලා දෙකකට (02) අයදුම් කළා සේ සැලකේ. එසේම ඒ ඒ ආගමේ පැවිදිවරයක් දරනා පාර්ශ්ව තම ආගමට අදාළ පාඨමාලාව සඳහා පමණක් ඉල්ලුම් කළ යුතු වේ.

උදා :- විද්‍යාව පාඨමාලාවට සිංහල මාධ්‍යයෙන් හා දෙමළ මාධ්‍යයෙන් යන මාධ්‍ය දෙකෙන් අයදුම් කරන අයදුම්කරුවකු පාඨමාලා දෙකක් සඳහා අයදුම් කළා සේ සැලකේ. එවිට එම අයදුම්කරුට අයදුම් කල හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණි.

10.5 *ගැසට්* නිවේදනයේ 6.2 – 'ස්ථිර පදිංචි නිර්ණය' යටතේ 6.2.1 ඡේදයට අදාළවන දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේය.

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| කිලිනොච්චිය | 11 |
| මන්නාරම | 12 |
| වවුනියාව | 13 |
| මුලතිව් | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

- එම දිස්ත්‍රික්ක අංක පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයට අයත් අංකය ඉතා නිවැරදිව යොමු කළ යුතු වේ.

10.6 අයදුම් කරන අවස්ථාව වනවිට යම් අයදුම්කරුවකු හට පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් (Personal E-mail Address) නොමැති නම් මාර්ගගත ක්‍රමවේදය (Online System) අනුව අයදුම් කිරීමට පෙර පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස් කර ගැනීම අනිවාර්ය වේ. මෙම විද්‍යුත්

තැපැල් ලිපිනය අයදුම්කරුට පෞද්ගලිකවන සේ සකස් කර තිබිය යුතු වේ.

10.7 එසේම යම් පාඨමාලාවකට *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් නොමැති ව අයදුම් කිරීමෙන් පසු, ඉන් අයදුම්කරුට සිදුවන අපහසුතාවන් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

10.8 සෑම අයදුම්කරුවකු ම මාර්ගගත ක්‍රමවේදය (Online System) හරහා අයදුම් කළ පසු එම අයදුම්පතෙහි පිටපතක් මුද්‍රණය කර ලබා ගැනීමේ හැකියාව අයදුම්කරු වෙත සලසා දී ඇති අතර එසේ ලබා ගන්නා ස්ථිර දෘඪ පිටපත (Hard Copy - PDF) තමන් භාරයේ රඳවා ගත යුතුය. යම් විමසීමක් හෝ අභියාචනයක් හෝ ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දී ම අදාළ ලේඛනයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ අනවධානයෙන් කටයුතු කිරීම හේතුවෙන් අයදුම්කරු පත්වන අපහසුතාවය පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය කිසිදු වගකීමක් දරනු නොලැබේ.

10.9 එමෙන්ම අයදුම්කරු විසින් අයදුම් කිරීම සිදු කළ පමණින් ඇතුළත් වීමට සුදුසුකම් නොලබයි. තව ද ඒ ඒ දිස්ත්‍රික්ක හෝ ජාතික පදනමින් ඇති පුරප්පාඩු සහ *ගැසට්* නිවේදනයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව පමණක් බඳවා ගැනීම සිදු කෙරේ. මේ සම්බන්ධයෙන් අවසාන තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම්වරයා සතු වේ.

10.10 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන් / සේවයෙන් පහ කරනු ලබන අතර, ඉන් ඉදිරියට රාජ්‍ය සේවයේ කිසිදු පත්වීමක් සඳහා නුසුදුස්සකු වනු ඇත.

**11.0** *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් හා කොන්දේසි මත මතු වන ගැටළු හෝ විශේෂ අවස්ථා පිළිබඳ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ / අධ්‍යාපන ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

**12.0** "2023 සහ 2024 වර්ෂයේ අ.පො.ස.(උ/පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට දිස්ත්‍රික්ක / ජාතික පදනමින් ශික්ෂණලාභීන් බඳවා ගැනීම - 2025" මැයෙන් 14.0 යටතේ ඉදිරි පිටුවල 14.1, 14.2, 14.3, 14.5, 14.6, 14.7 වගුවල දක්වා ඇත්තේ ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට හැර අනෙකුත් විද්‍යාපීඨවලට මාධ්‍ය අනුව එක්, එක් පාඨමාලා සඳහා දිස්ත්‍රික්ක / ජාතික මට්ටමින් බඳවා ගන්නා සංඛ්‍යාවවන අතර 14.4, 14.8 වගුවල දක්වා ඇත්තේ ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් එක්, එක් පාඨමාලා සඳහා වතු දිස්ත්‍රික්ක / ජාතික පදනමින් බඳවා ගන්නා සංඛ්‍යාව වේ.

**13.0** මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල භාෂා පාඨය සමඟ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨවල යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් වේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 27 දින,
අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2023 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර) - සිංහල මාධ්‍යය

| | | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂයය නාමය | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව් | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
| ප්‍රාථමික අධ්‍යාපනය | 192 | 191 | 11 | 10 | 9 | 9 | 8 | 7 | 10 | 9 | 8 | 0 | 0 | 5 | 3 | 0 | 5 | 8 | 7 | 17 | 7 | 10 | 6 | 11 | 8 | 13 | 10 | 191 |
| විද්‍යාව | 53 | 52 | 4 | 4 | 4 | 4 | 1 | 1 | 4 | 3 | 2 | 0 | 0 | 2 | 1 | 0 | 1 | 2 | 1 | 3 | 1 | 3 | 1 | 2 | 2 | 3 | 3 | 52 |
| ගණිතය | 48 | 47 | 4 | 3 | 3 | 3 | 1 | 1 | 3 | 3 | 2 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 3 | 1 | 3 | 1 | 2 | 3 | 3 | 3 | 47 |
| සමාජීය විද්‍යාව | 15 | 15 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 15 |
| බුද්ධ ධර්මය | 55 | 55 | 4 | 3 | 3 | 4 | 2 | 1 | 3 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 3 | 2 | 5 | 1 | 4 | 2 | 4 | 2 | 4 | 3 | 55 |
| කතෝලික ධර්මය | 7 | 6 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 6 |
| ක්‍රිස්තියානි ධර්මය | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| ඉස්ලාම් | 3 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 74 | 74 | 4 | 5 | 4 | 4 | 2 | 2 | 3 | 4 | 4 | 0 | 0 | 3 | 2 | 0 | 2 | 3 | 2 | 6 | 2 | 4 | 3 | 4 | 3 | 4 | 4 | 74 |
| චිත්‍ර | 21 | 20 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 20 |
| නැටුම් (පෙරදිග) | 19 | 18 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 18 |
| සංගීතය (පෙරදිග) | 26 | 25 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 2 | 25 |
| නාට්‍ය සහ රංගකලාව | 8 | 7 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 7 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 45 | 44 | 3 | 3 | 2 | 3 | 2 | 2 | 2 | 3 | 2 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 44 |
| ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය | 15 | 15 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 15 |
| කෘෂිකර්ම තාක්ෂණවේදය | 23 | 22 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 22 |
| නිර්මාණකරණය හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය | 5 | 5 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 5 |
| නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය | 18 | 18 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 18 |
| දෙවන භාෂාව (සිංහල) | 23 | 22 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 3 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 22 |
| වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය | 13 | 12 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 12 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය | 17 | 16 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 2 | 16 |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 8 | 7 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 7 |
| එකතුව | 689 | 674 | 43 | 34 | 33 | 38 | 24 | 21 | 37 | 33 | 27 | 3 | 2 | 24 | 16 | 3 | 13 | 27 | 20 | 47 | 23 | 36 | 25 | 35 | 30 | 42 | 38 | 674 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2023 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.2 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර) - දෙමළ මාධ්‍යය

| | | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **විෂයය නාමය** | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව් | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
| ප්‍රාථමික අධ්‍යාපනය | 96 | 96 | 2 | 2 | 2 | 3 | 3 | 4 | 2 | 2 | 1 | 11 | 4 | 3 | 4 | 5 | 8 | 7 | 8 | 3 | 3 | 3 | 2 | 5 | 2 | 4 | 3 | 96 |
| විද්‍යාව | 40 | 40 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 3 | 2 | 2 | 2 | 2 | 3 | 2 | 3 | 2 | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 40 |
| ගණිතය | 40 | 40 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 3 | 3 | 3 | 2 | 3 | 2 | 2 | 2 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 40 |
| සමාජීය විද්‍යාව | 18 | 17 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 17 |
| හින්දු ධර්මය | 10 | 10 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 10 |
| ඉස්ලාම් | 10 | 10 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 10 |
| කතෝලික ධර්මය | 7 | 6 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 6 |
| ක්‍රිස්තියානි ධර්මය | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| දෙමළ භාෂාව හා සාහිත්‍යය | 23 | 22 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 22 |
| චිත්‍ර | 10 | 10 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 10 |
| නැටුම් (භරත) | 5 | 5 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 5 |
| සංගීතය (කර්නාටක) | 5 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 5 |
| නාට්‍ය සහ රංගකලාව | 5 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 5 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 15 | 15 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 15 |
| ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය | 13 | 12 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 12 |
| කෘෂිකර්ම තාක්ෂණවේදය | 8 | 7 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 7 |
| නිර්මාණකරණය හා කලාත්මක නිශ්පාදන තාක්ෂණවේදය | 5 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | |
| නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය | 15 | 15 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 15 |
| දෙවන භාෂාව (දෙමළ) | 13 | 12 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 12 |
| වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය | 4 | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 4 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය | 10 | 10 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 10 |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 8 | 7 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 7 |
| එකතුව | 361 | 354 | 10 | 8 | 11 | 14 | 10 | 13 | 7 | 7 | 4 | 35 | 17 | 17 | 17 | 20 | 25 | 20 | 23 | 13 | 14 | 8 | 10 | 18 | 7 | 14 | 12 | 354 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2023 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර) - ඉංග්‍රීසි මාධ්‍යය

| | | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂය නාමය | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව් | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
| විද්‍යාව | 19 | 19 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 19 |
| ගණිතය | 19 | 19 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 19 |
| ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය | 194 | 194 | 10 | 11 | 10 | 11 | 8 | 6 | 9 | 9 | 8 | 8 | 5 | 4 | 4 | 4 | 6 | 6 | 6 | 12 | 8 | 9 | 7 | 9 | 8 | 8 | 8 | 194 |
| සමාජ විද්‍යාව | 8 | 7 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 7 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 5 | 5 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 5 |
| බටහිර සංගීතය | 3 | 2 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 65 | 65 | 3 | 4 | 3 | 4 | 3 | 3 | 3 | 3 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 3 | 3 | 2 | 2 | 2 | 2 | 3 | 2 | 3 | 65 |
| එකතුව | 313 | 311 | 18 | 17 | 15 | 19 | 13 | 10 | 15 | 14 | 11 | 15 | 8 | 7 | 7 | 7 | 10 | 9 | 11 | 18 | 11 | 14 | 11 | 12 | 12 | 13 | 14 | 311 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2023 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.4 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (සිංහල / දෙමළ / ඉංග්‍රීසි මාධ්‍ය)

| විෂයය නාමය | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | කුරුණෑගල | බදුල්ල | මොනරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සිංහල මාධ්‍යය** | | | | | | | | | | | | | | | |
| ප්‍රාථමික අධ්‍යාපනය | 6 | 6 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | **6** |
| විද්‍යාව | 5 | 4 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | **4** |
| ගණිතය | 3 | 2 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **2** |
| සමාජීය විද්‍යාව | 5 | 5 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | **5** |
| **දෙමළ මාධ්‍යය** | | | | | | | | | | | | | | | |
| ප්‍රාථමික අධ්‍යාපනය | 13 | 12 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | **12** |
| විද්‍යාව | 7 | 7 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | **7** |
| ගණිතය | 5 | 5 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 0 | **5** |
| සමාජීය විද්‍යාව | 8 | 7 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | **7** |
| දෙමළ භාෂාව හා සාහිත්‍යය | 6 | 6 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | **6** |
| චිත්‍ර | 6 | 6 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | **6** |
| සංගීතය (කර්නාටක) | 5 | 5 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | **5** |
| නැටුම් (භරත) | 5 | 5 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | **5** |
| **ඉංග්‍රීසි මාධ්‍යය** | | | | | | | | | | | | | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 5 | 5 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | **5** |
| එකතුව | 79 | 75 | 7 | 4 | 8 | 6 | 10 | 6 | 6 | 5 | 6 | 5 | 6 | 6 | 75 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2024 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.5 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර) - සිංහල මාධ්‍යය

| | | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂයය නාමය | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව් | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
| ප්‍රාථමික අධ්‍යාපනය | 192 | 191 | 10 | 11 | 10 | 11 | 8 | 6 | 13 | 12 | 11 | 0 | 0 | 6 | 5 | 0 | 6 | 5 | 7 | 13 | 6 | 9 | 7 | 9 | 8 | 9 | 9 | 191 |
| විද්‍යාව | 53 | 52 | 3 | 3 | 2 | 3 | 2 | 2 | 3 | 4 | 3 | 0 | 0 | 2 | 2 | 0 | 0 | 2 | 2 | 5 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 52 |
| ගණිතය | 48 | 47 | 2 | 3 | 2 | 3 | 2 | 1 | 3 | 2 | 2 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 2 | 2 | 3 | 2 | 3 | 2 | 3 | 2 | 3 | 2 | 47 |
| සමාජීය විද්‍යාව | 15 | 15 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 15 |
| බුද්ධ ධර්මය | 55 | 55 | 3 | 4 | 2 | 4 | 2 | 2 | 3 | 3 | 2 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 5 | 3 | 2 | 2 | 2 | 3 | 3 | 3 | 3 | 2 | 55 |
| කතෝලික ධර්මය | 6 | 6 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 6 |
| ක්‍රිස්තියානි ධර්මය | 2 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| ඉස්ලාම් | 3 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 2 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 74 | 74 | 4 | 5 | 4 | 5 | 3 | 3 | 5 | 4 | 3 | 0 | 0 | 3 | 2 | 0 | 0 | 3 | 2 | 5 | 3 | 3 | 3 | 3 | 3 | 4 | 4 | 74 |
| චිත්‍ර | 21 | 20 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 20 |
| නැටුම් (පෙරදිග) | 19 | 18 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 18 |
| සංගීතය (පෙරදිග) | 26 | 25 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 2 | 1 | 1 | 25 |
| නාට්‍ය සහ රංගකලාව | 8 | 7 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 7 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 45 | 44 | 2 | 3 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 2 | 2 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 44 |
| ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය | 15 | 15 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 15 |
| කෘෂිකර්ම තාක්ෂණවේදය | 23 | 22 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 22 |
| නිර්මාණකරණය හා කලාත්මක නිශ්පාදන තාක්ෂණවේදය | 5 | 5 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | |
| නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය | 18 | 18 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 18 |
| දෙවන භාෂාව (සිංහල) | 23 | 22 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 22 |
| වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය | 13 | 12 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 12 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය | 17 | 16 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 16 |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 8 | 7 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 7 |
| එකතුව | 689 | 674 | 32 | 41 | 33 | 36 | 31 | 25 | 37 | 37 | 33 | 3 | 1 | 22 | 22 | 1 | 9 | 27 | 26 | 40 | 26 | 33 | 28 | 35 | 29 | 32 | 35 | 674 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2024 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.6 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර) - දෙමළ මාධ්‍යය

| | | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **විෂයය නාමය** | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව් | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
| ප්‍රාථමික අධ්‍යාපනය | 96 | 96 | 2 | 2 | 2 | 3 | 2 | 4 | 1 | 1 | 1 | 10 | 4 | 5 | 5 | 5 | 9 | 9 | 7 | 4 | 4 | 2 | 2 | 5 | 3 | 2 | 2 | 96 |
| විද්‍යාව | 40 | 40 | 2 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 4 | 2 | 2 | 3 | 2 | 3 | 2 | 2 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 40 |
| ගණිතය | 40 | 40 | 1 | 1 | 1 | 2 | 1 | 2 | 1 | 1 | 1 | 4 | 3 | 2 | 2 | 3 | 2 | 2 | 3 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 40 |
| සමාජීය විද්‍යාව | 18 | 17 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 17 |
| හින්දු ධර්මය | 10 | 10 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 10 |
| ඉස්ලාම් | 10 | 10 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 2 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 10 |
| කතෝලික ධර්මය | 6 | 6 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 6 |
| ක්‍රිස්තියානි ධර්මය | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| දෙමළ භාෂාව හා සාහිත්‍යය | 23 | 22 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 2 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 22 |
| චිත්‍ර | 10 | 10 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 10 |
| නැටුම් (භරත) | 5 | 5 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 5 |
| සංගීතය (කර්නාටක) | 5 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 5 |
| නාට්‍ය සහ රංගකලාව | 5 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 5 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 15 | 15 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 15 |
| ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය | 13 | 12 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 12 |
| කෘෂිකර්ම තාක්ෂණවේදය | 8 | 7 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 7 |
| නිර්මාණකරණය හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය | 5 | 5 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | |
| නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය | 15 | 15 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 15 |
| දෙවන භාෂාව (දෙමළ) | 13 | 12 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 12 |
| වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය | 4 | 4 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය | 10 | 10 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 10 |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 8 | 7 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 7 |
| එකතුව | 361 | 354 | 11 | 8 | 8 | 11 | 11 | 17 | 6 | 6 | 4 | 32 | 23 | 19 | 21 | 18 | 25 | 24 | 22 | 15 | 11 | 11 | 7 | 15 | 7 | 10 | 12 | 354 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2024 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.7 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර) - ඉංග්‍රීසි මාධ්‍යය

| | | | බස්නාහිර | | | මධ්‍යම | | | දකුණ | | | උතුර | | | | | නැගෙනහිර | | | වයඹ | | උතුරු මැද | | ඌව | | සබරගමුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂය නාමය | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | ගම්පහ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | හම්බන්තොට | යාපනය | මන්නාරම | වවුනියාව | මුලතිව් | කිලිනොච්චිය | මඩකලපුව | අම්පාර | ත්‍රිකුණාමලය | කුරුණෑගල | පුත්තලම | අනුරාධපුර | පොළොන්නරුව | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
| විද්‍යාව | 19 | 19 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 |
| ගණිතය | 19 | 19 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 |
| ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය | 194 | 194 | 13 | 11 | 11 | 12 | 8 | 7 | 10 | 8 | 6 | 6 | 5 | 6 | 5 | 5 | 5 | 6 | 5 | 11 | 8 | 6 | 5 | 9 | 8 | 9 | 9 | 194 |
| සමාජ විද්‍යාව | 8 | 7 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 7 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 5 | 5 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 5 |
| බටහිර සංගීතය | 3 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 65 | 65 | 4 | 4 | 3 | 4 | 3 | 3 | 3 | 3 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 3 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 3 | 2 | 65 |
| එකතුව | 313 | 311 | 19 | 19 | 15 | 18 | 13 | 12 | 16 | 14 | 10 | 13 | 8 | 9 | 8 | 7 | 8 | 9 | 11 | 16 | 12 | 10 | 10 | 14 | 12 | 14 | 14 | 311 |

14.0 අ.පො.ස (උ.පෙළ) විභාගය - 2024 ප්‍රතිඵල මත ජාතික සහ දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවාගැනීම - 2025

14.8 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ශික්ෂණලාභීන් බඳවාගැනීම (සිංහල / දෙමළ / ඉංග්‍රීසි මාධ්‍ය)

| විෂය නාමය | ජාතික පදනම | දිස්ත්‍රික් පදනම | කොළඹ | කළුතර | මහනුවර | මාතලේ | නුවරඑළිය | ගාල්ල | මාතර | කුරුණෑගල | බදුල්ල | මොණරාගල | රත්නපුර | කෑගල්ල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සිංහල මාධ්‍යය** | | | | | | | | | | | | | | | |
| ප්‍රාථමික අධ්‍යාපනය | 6 | 6 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 6 |
| විද්‍යාව | 5 | 4 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 4 |
| ගණිතය | 3 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 2 |
| සමාජීය විද්‍යාව | 5 | 5 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 5 |
| **දෙමළ මාධ්‍යය** | | | | | | | | | | | | | | | |
| ප්‍රාථමික අධ්‍යාපනය | 13 | 12 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 12 |
| විද්‍යාව | 7 | 7 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 7 |
| ගණිතය | 5 | 5 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 5 |
| සමාජීය විද්‍යාව | 8 | 7 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 7 |
| දෙමළ භාෂාව හා සාහිත්‍යය | 6 | 6 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 6 |
| චිත්‍ර | 6 | 6 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 6 |
| සංගීතය (කර්නාටක) | 5 | 5 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 5 |
| නැටුම් (භරත) | 5 | 5 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 5 |
| **ඉංග්‍රීසි මාධ්‍යය** | | | | | | | | | | | | | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 5 | 5 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 5 |
| එකතුව | **79** | **75** | **5** | **8** | **4** | **6** | **7** | **4** | **7** | **7** | **7** | **6** | **7** | **7** | 75 |

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (නොවැම්බර්)

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තු මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය **කොළඹ** දී පැවැත්වේ.

1. ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

2. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘති වලට අනුකූලව සකස් කර එවිය යුතු ය. එම. ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කළ යුතු අතර, එම අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් **2025.11.21 දින හෝ ඊට පෙර** ලැබෙන සේ **"ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (නොවැම්බර්)" යනුවෙන් සඳහන් විය යුතු ය. අයදුම්පත්‍ර කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. පළමු වරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 230 ක් වටිනා මුදල් ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 57.50 ක් වටිනා මුදල් ගාස්තුවක් ද ගෙවිය යුතු වේ. එම ගෙවිය යුතු මුදල මහරගම ලංකා බැංකු ශාඛාවේ අංක 7041294 ආයුර්වේද කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කර ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. කුමන කරුණක් යටතේ වුව ද, එම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

"තමන්ගේ ලිපිනය නිවැරදිව ලියූ අහල් 9x4 මුද්දර සහිත (රු. 110) ලියුම් කවර දෙකක් අයදුම්ත්‍රය සමඟ එවිය යුතු ය."

4. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :-

අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

iii. වලංගු රියදුරු බලපත්‍රය

5. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් තම අත්සන් නියමිත පරිදි සහතික කරවා ගන්නා ලද ප්‍රවේශපත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකු විභාගය පැවැත්වීමට අවම වශයෙන් දින හතකට (07) පෙර ප්‍රවේශපත්‍රය නොලැබුණහොත්, ප්‍රවේශපත්‍ර නොලැබුණු බවට පහත සඳහන් විස්තර සමග 011-2745962 යන දුරකතන අංකයට හෝ පහත සඳහන් විස්තර සමග "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතු ය.

i. විභාගයේ නම :
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම :
iii. අයදුම්කරුගේ ලිපිනය :
iv. අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනය :

6. විභාග පටිපාටිය :
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව)

i. මූල්‍ය ක්‍රම - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක් -

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි I වැනි කාණ්ඩය (x පරිච්ඡේදය හැර)

ii. ආයතන රෙගුලාසි හා කාර්ය පටිපාටික නීති සංග්‍රහය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(අ) ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය

iii. ආරෝග්‍යශාලා පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක් -

(අ) ආරෝග්‍යශාලා පිළිබඳ බල පැවැත්වෙන සාමාන්‍ය නීති රීති

(ආ) ආරෝග්‍යශාලා පිරිසිදුව තබා ගැනීම

(ඇ) රෝගීන් සම්බන්ධව බල පැවැත්වෙන නීතිරීති

(ඈ) රෝගීන්ට නියමිත ආහාරපාන ලබා ගන්නා විධි

(ඉ) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය

(ඊ) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීතිරීති

(උ) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය

(ඌ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි

(එ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම්, ලිපි ලේඛන, පොත් පත් පවත්වාගෙන යාමට අදාළ රෙගුලාසි

(ඔ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහය

(ඕ) ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු

iv රාජ්‍ය භාෂා පරීක්ෂණය භාෂා ප්‍රවීණතාවය සම්බන්ධයෙන් 2020.10.27 ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනු අපේක්ෂකයා විසින් පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාවක | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු වේ. අ.පො.ස. (සා/පෙළ) මවුබස සඳහා සාමාර්ථ සුදුසුකමක් ලබා ගැනීම මේ සඳහා ප්‍රමාණවත් වේ. |
| අනෙකුත් රාජ්‍ය භාෂාවක් : | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු යි. |

v. විභාගය සමත් වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතු ය. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුව හොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම්.

2025 නොවැම්බර් මස 07 දින,
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (නොවැම්බර්)***

**විභාග අංකය :** [ ]
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)
**විභාගයට පෙනී සිටින මාධ්‍යය** [ ]
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල -S දෙමළ -T

01. මුලකුරු සමඟ නම (Mr./ Mrs./ Miss) : ………………………..…………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

02. මුලකුරු සමඟ නම : ………………………………………………… මයා/ මිය/ මෙනෙවිය
(සිංහලෙන්/ දෙමළෙන්)

03. මුලකුරු වලින් හැඳින්වෙන නම් : .......................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

04. මුලකුරු වලින් හැඳින්වෙන නම් : .......................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. (i) සේවා ස්ථානය හා ලිපිනය :
……………………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) සේවා ස්ථානයට අයත් පළාත : ………………………………………

07. (i) සේවා ස්ථානය හා ලිපිනය :
……………………………………………………………………………………………
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) රාජකාරි දුරකථන අංකය : ………………………………………

(iii) පෞද්ගලික දුරකථන අංකය : ………………………………………

08. (i) දැනට දරන තනතුර :……………………………………………………………………………………

(ii) පත්වීම් ලිපියේ අංකය හා දිනය : ………………………………………

09. (i) ඔබ දැන් ඉදිරිපත් වන විෂයයන් -

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

(ii) ඔබ මින් ඉහත විභාගයක දී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයකින් හෝ සමත් වී තිබේ ද? මූල්‍ය ක්‍රම/ ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික නීති සංග්‍රහය/ ආරෝග්‍යශාලා පරිපාලනය එසේ නම් විභාග අංකය, වර්ෂය සහ මාසය සඳහන් කරන්න

| *විෂයය* | *විෂයය අංකය* | *වර්ෂය හා මාසය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

10. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :
විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද මුදල් වටිනාකම.
**(බැංකු රිසිට් පත මෙහි අලවන්න)**

| |
|---|
| |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීතිරීති පිළිබඳ මම එකඟ වෙමි.

……………………………
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය : ………………

*සටහන* :- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...................…………… ……………………………………………….... මහතා / මහත්මිය / මෙනවිය ....................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

…………………….,
සහතික කරන්නාගේ අත්සන
නිල මුද්‍රාව.

නම : ……………………...........
පදවි නාමය : ………………………
ලිපිනය : ……………………........
දිනය : ……………………..........

11-74

---

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

1.0 2017.06.21 වැනි දින හා අංක 2024/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ Our Services යටතේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025 දෙසැම්බර් 08 දින වේ.** මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 පෙබරවාරි මස කොළඹ දී** පවත්වනු ලැබේ.

*සටහන 1* - මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 නොවැම්බර් මස 10 දින පෙ.ව. 9.00**ට විවෘතවන අතර **2025 දෙසැම්බර් මස 08 දින ප.ව. 9.00**ට අවසන් වේ.

*සටහන 2* - නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

සටහන 3 - අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

2.0 මෙම විභාග ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත. තව ද පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප් පරිමාණය* .- අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව MN 3 - 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය
රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 – රු. 100,040/- ක් වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

4.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට නිලධාරියා යටත් විය යුතු වේ.

5.0 සේවා කොන්දේසි :-

i. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2024/35 සහ 2017.06.21 වැනි දින දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 දින දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

ii. සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියකු පත්වීම් දින සිට වසරක පරිවාස කාලයකට යටත් වේ. එම පරිවාස කාලය තුළ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක බවට පත්වීම් බලධරයා සෑහීමකට පත්වන්නේ නම් අදාළ නිලධාරියාගේ පත්වීම ස්ථිර කරනු ලැබේ. එසේ වුව ද ඔවුන් පත්වීම් දින සිට වසර 3ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය.

iii. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

iv. ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

6.0 *සුදුසුකම් :-* මෙම විභාගය සඳහා තරග කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතුය.

6.1 අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම

6.2 වෘත්තීය සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම ;

*හෝ*

(ආ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

6.3 පළපුරුද්ද :

(අ) රජයේ සේවයේ දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණයේ පුස්තකාල සහායක/පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීම සහ එම තනතුරෙහි වසර 10ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

(ආ) ඉහත 6.2 හි (අ) සහ (ආ) හි සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් හෝ සම්පූර්ණ කර ඩිප්ලෝමා සහතිකය ලබා ඇත්නම්, එම අපේක්ෂකයන් හට රජයේ සේවයේ දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණයේ පුස්තකාල සහායක/පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීම සහ අයදුම්පත් කැඳවන අවසාන දිනට එම තනතුරෙහි වසර 5ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :-**

1. (i) මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

   (ii) ඉහත 6.3 (අ) සහ (ආ) හි සඳහන් පරිදි මෙම තරග විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ රජයේ සේවයේ නිලධාරීන්හට පමණි. (පළාත් රාජ්‍ය සේවාවල නිලධාරීන්හට මෙම තරග විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.)

2. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණකර තිබීම අනිවාර්ය වේ.

3. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

4. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

5. අයදුම්පත් කැඳවන අවසාන දිනට රජයේ සේවයේ (ඉහත 6.3 (අ) සහ (ආ) හි සඳහන්) තනතුරක ස්ථිර කර තිබිය යුතුය.

6. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු අතර, ඒ බව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතිකකර තිබිය යුතුය.

7.0 විභාග කොන්දේසි :

(i) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව යොමු කිරීම (submit) කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transaction),

iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon),

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

සටහන:

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(iii) මෙහි දැක්වෙන සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින්/වෙබ් නිවේදනයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම,

ජාතික හැඳුනුම්පත් අංකය, යොමු අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) ප්‍රවේශ පත්‍රය පරීක්ෂාකර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

8.0 පත්වීම සඳහා අයදුම්කරු තෝරා ගනු ලැබී නම්, ඔහු/ ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා තිබිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

9.0 විභාගයට පෙනී සිටීම :

(*අ*) විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ/ ඇයගේ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවකු තමාට නියමකර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම අදාළ ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු රීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළ කර ඇත.

***සටහන :*** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

10.0 අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක් ඔහු/ ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින්ම වසන්කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

12.0 විභාග පරිපාටිය :

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| (01) පුස්තකාල විද්‍යාව | පැය 03 | 100 | 40% |
| (02) බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| (03) සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

ඉහත විෂයයන්ට අදාළ විෂයය නිර්දේශය පහත පරිදි වේ.

12.1 (01) පුස්තකාල විද්‍යාව

(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය

පුස්තකාල හා පුස්තකාල ඉතිහාස
පුස්තකාලයන්හි සාමාජික කාර්යභාරය
පොත් සහ විවිධ ලේඛන හා ලේඛන, මුද්‍රිත නොවන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශය
විද්වත් වෘත්තීය සංගම්,
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්

පුස්තකාල වර්ග
පාසල් සහ විද්‍යායතන පුස්තකාල
රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල
මහජන පුස්තකාල
පුස්තකාල කමිටු
සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

(2) දැනුම සහ තොරතුරු සංවිධානය

ග්‍රන්ථ වර්ගීකරණය හා එහි අරමුණු, ප්‍රයෝජන
ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග
ඩිවි දශම වර්ගීකරණය
සුචිකරණය, එහි අරමුණු
AACR 2 සුචිකරණ නීති සංග්‍රහය
සංලේඛය හා ග්‍රන්ථ විස්තරය
සුචි වර්ග

(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා

විවිධ පුස්තකාල සම්පත්
පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය
ප්‍රතිග්‍රහණය සහ ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
පිරිසැකසුම්කරණය
තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)
පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම්

- බහුවරණ, කෙටි පිළිතුරු, ව්‍යුහගත සහ අර්ධ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න 05කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 03යි.

12.2 (02) බුද්ධි පරීක්ෂණය

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතාවය වටහා ගැනීමෙහිලා අයදුම්කරුවකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි.

12.3 (03) සාමාන්‍ය දැනුම

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂයය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අයදුම්කරුගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි.

**සටහන :**
පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතු වන අතර සීමිත තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

**13.0 විභාග ප්‍රතිඵල :**

මෙම නිවේදනයේ 12.0 හි සටහන අනුව එක් එක් විෂයයෙන් ලකුණු 40%ට නොඅඩුව ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත

ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

14.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

11 - 130/1

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

**1.0** **2017.06.21 දින හා අංක 2024/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ Our Services යටතේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 දෙසැම්බර් 08 දින වේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.**

**සටහන 1** -මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 නොවැම්බර් මස 10 වන දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2025 දෙසැම්බර් මස 08 වන දින ප.ව. 9.00ට** අවසන් වේ.

**සටහන 2** - දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

2.0 මෙම විභාග ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත. තව ද පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප් පරිමාණය: අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව MN 3 -2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය

රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 – රු. 100,040/- ක් වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

4.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරියා යටත් විය යුතු වේ.

5.0 මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන **ආබාධිත අයදුම්කරුවන් අතරින්** ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය

සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින්වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

**සටහන -** මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර, <u>ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය.</u>

6.0 **සේවා කොන්දේසි :-**

i. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2024/35 සහ 2017.06.21 වැනි දින දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වන දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

ii. විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. නිලධාරින් III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03)ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම හා නිලධරයන්ගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වන්නේ නම් වසර තුන අවසානයේ දී ඒ බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් අදාළ නිලධාරියාගේ පත්වීම ස්ථිර කරනු ලැබේ.

iii. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

iv. ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

7.0 **සුදුසුකම් :** ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව 2007.12.08 දිනට හෝ ඊට පෙර හා 1995.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

(ඇ) අධ්‍යාපන සුදුසුකම් :

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම

(ඉ) වෘත්තිය සුදුසුකම් **:**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම;

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා

පාඨමාලාව සමත්ව තිබීම;

*හෝ*

(iii) පුස්තකාල විද්‍යාව පිළිබඳ ඉහත (i) හෝ (ii) සුදුසුකම්වලට වඩා ඉහළ සුදුසුකමක් ලබා තිබීම (එවැනි සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාලවල බලධාරීන් හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ද විමසමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.)

**සටහන :**

(i) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **අයදුම්පත් කැඳවන අවසාන දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

(ii) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

8.0 **විභාග කොන්දේසි :**

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව යොමු කිරීම (submit) කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transaction)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

**සටහන:**

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(i) මෙහි දැක්වෙන සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින්/වෙබ් නිවේදනයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය

නොලද අයදුම්කරුවකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, යොමු අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

(v) විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**9.0 විභාගයට පෙනී සිටීම :**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ/ඇයගේ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම අදාළ ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු රීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළකර ඇත.

*සටහන :* අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

**10.0 අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**11.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

**12.0 විභාග පටිපාටිය :**

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ.

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| (01) පුස්තකාල විද්‍යාව | පැය 03 | 100 | 40% |
| (02) බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| (03) සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

ඉහත විෂයයන්ට අදාළ විෂයය නිර්දේශය පහත පරිදි වේ:

12.1 (1) පුස්තකාල විද්‍යාව :

(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය

පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන සහ නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල
ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශනය
මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂයය කෙරෙහි බලපෑම

*පුස්තකාල වර්ග*

විශේෂ පුස්තකාල

**රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්**

ශාස්ත්‍රීය පුස්තකාල

**විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්**

පාසල් පුස්තකාලය

**මහජන පුස්තකාලය**

**පිරිවෙන් පුස්තකාල හා ආරාමික/ ආගමික ආයතන පුස්තකාල**

පුස්තකාල කමිටු - ව්‍යුහය, අවශ්‍යතා, වැදගත්කම හා කාර්යභාරය
පුස්තකාල වෘත්තියට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්යභාරය : ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකාව, බ්‍රිතාන්‍යය)
පුස්තකාල ගොඩනැගිලි - සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු
පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩි දියුණු කිරීම
පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)
ආපදා (Disasters) සහ ආපදා කළමනාකරණය (Disaster Management)

(2) *දැනුම සහ තොරතුරු සංවිධානය :*

ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන

ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිත වන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය

පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහය (AACR) සම්ප්‍රදාය
ග්‍රන්ථ විස්තරය
AACR 2 සංස්කරණ භාවිත කරමින් සංඛ්‍යා ලේඛන සම්පාදනය

(3) *පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා :*

විවිධ පුස්තකාල සම්පත්

එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම

පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(i) පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම, මූලාශ්‍ර
(ii) ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය,පිරිසැකසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා
(iii) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම් හා වාරණය

ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය
(Current Awareness Service)

පාඨක අධ්‍යාපන වැඩසටහන්

මහජන සම්බන්ධතා සහ පුස්තකාල ප්‍රචාරණය

*(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය*

පුස්තකාලවල පරිගණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන්වල දී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායිතාව

- ඉහත ක්ෂේත්‍ර 4 ආවරණය වන සේ සකස් කෙරෙන ව්‍යුහගත රචනා ශෛලියේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 03 යි.

*12.2 (02) බුද්ධි පරීක්ෂණය :*

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතාව වටහා ගැනීමෙහි ලා අයදුම්කරුවකු සතු හැකියාව මැන බැලීම.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.
  කාලය පැය 01 යි.

12.3 (03) සාමාන්‍ය දැනීම

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂයය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අයදුම්කරුගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01 යි

***සටහන :***

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින්වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතුවන අතර, විවෘත තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

**13.0 විභාග ප්‍රතිඵල :**

මෙම නිවේදනයේ 12.0 හි සටහන අනුව එක් එක් විෂයයෙන් ලකුණු 40%ට නොඅඩුව ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

14.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතුය.

තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ මුල සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 03 දින,
කොළඹ 07,
නිදහස් චතුරස්‍රය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

11 - 130/2

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024**

**1.0** **රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ Our Service යටතේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි.**
**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 දෙසැම්බර් මස 08 දින වේ.**

*සටහන 1* - මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 නොවැම්බර් මස 10 දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 දෙසැම්බර් මස 08 දින ප.ව. 9.00**ට අවසන් වේ.

*සටහන 2* - දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**1.1** **මෙම නිවේදනයේ, "සේවය" යන පදයෙන් ඒකාබද්ධ සේවයේ භාෂා පරිවර්තක සේවය අදහස් කෙරේ.**

**1.2** **මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත. විභාගයේ ප්‍රතිඵල මත පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක කරන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට, පත්වීම් බලධරයාට බලය ඇත. සේවා අවශ්‍යතාව මත ඒ ඒ මාධ්‍යයන්ගෙන් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.**

**2.0** **පහත සඳහන් මාධ්‍ය සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ.**

(i) සිංහල/දෙමළ - දෙමළ/සිංහල
(ii) සිංහල/ඉංග්‍රීසි - ඉංග්‍රීසි/සිංහල
(iii) දෙමළ/ඉංග්‍රීසි - ඉංග්‍රීසි/දෙමළ

3.0 වැටුප් පරිමාණය: අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව MN 6 -2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි අතර එයට අදාළ වැටුප් පරිමාණය

රු. 62,230 – 10x1,190 – 11x1,360 – 15x1,670 - රු.114,140-/- ක් වේ.

පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබ මෙම වැටුප් පරිමාණයේ 12 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ. ඔබට වැටුප් ගෙවීම සිදු කරනුයේ උක්ත 10 /2025 චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වේ.

4.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට නිලධාරියා යටත් විය යුතුය.

5.0 මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන **ආබාධිත අයදුම්කරුවන් අතරින්** ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙල අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින්වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

*සටහන.* **-** මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර, **ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය.**

6.0 සේවා කොන්දේසි :

I. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 829/7 සහ 1994.07.26 වැනි දින දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියට පත්කරනු ලැබේ.

II. විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියට පත් කරනු ලබන නිලධාරියකු පත්වීම් දින සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. 4වන වැටුප් පියවරට පෙර රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

III. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන් ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

IV. ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

7.0 සුදුසුකම් : රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් අදාළ වේ:-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ආ) විශිෂ්ට චරිතයකින් යුතු විය යුතු ය;

(ඇ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය;

(ඈ) අධ්‍යාපන සුදුසුකම් **:**

1. අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී හෝ ඊට සමාන විභාගයක දී අදාළ පරිවර්තන භාෂා මාධ්‍යය 02 සඳහා සම්මාන සාමර්ථ්‍ය ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම;

*සහ*

2. i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

ii. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් ලබා තිබීම;

(ඉ) වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවකු අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2004.12.08 දිනට හෝ ඊට පෙර හා 1985.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

*සටහන* **-** 1. රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල නියුතු නිලධාරින්ට ඉහත වයස් සීමාව බලනොපානු ඇත.

2. ඉහත උපාධි සහතික හෝ වෙනත් සහතික, අයදුම්පත් භාර ගන්නා **අවසාන දින හෝ ඊට පෙර දිනක** සිට වලංගු වන්නක් විය යුතු වේ.

3. සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා විෂයයන්ගෙන් 2 ක් තම උපාධියේ දී සමත් වී ඇති විට එවැනි සුදුසුකම් ලත් අයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා වැටුප් පියවර දෙකක් ඉහළින් තබනු ඇත.

8.0 විභාග කොන්දේසි :

(i) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු ය. සම්පූර්ණ කරන ලද තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව යොමු කිරීම (submit) කළ යුතු ය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:-

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transaction);

iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon);

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන:*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(iii) මෙහි දැක්වෙන සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින්/වෙබ් නිවේදනයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, යොමු අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(v) විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

9.0 **විභාගයට ඇතුළත් වීම :**

(*අ*) විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ/ ඇයගේ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවකුම අදාළ ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු රීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළ කර ඇත.

***සටහන :*** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10.0 **අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ:-

I. ජාතික හැඳුනුම්පත;

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;

III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11.0 **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

12.0 **විභාග ක්‍රමය** : ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය යන කොටස් දෙකකින් යුක්තය.

12.1 **ලිඛිත විභාගය** : පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍ර :-

(1) පරිවර්තනය - ලකුණු 100 - පැය 03 ක ප්‍රශ්න පත්‍රයක්;

(2) ඉංග්‍රීසි භාෂාව - ලකුණු 100 - පැය 01 මිනිත්තු 30ක ප්‍රශ්න පත්‍රයක්;

(3) සිංහල භාෂාව - ලකුණු 100 - පැය 01 මිනිත්තු 30ක ප්‍රශ්න පත්‍රයක්;

(4) දෙමළ භාෂාව - ලකුණු 100 - පැය 01 මිනිත්තු 30ක ප්‍රශ්න පත්‍රයක්;

(5) අවබෝධය - ලකුණු 100 - පැය 01 මිනිත්තු 30ක ප්‍රශ්න පත්‍රයක්.

12.1.1 විෂය නිර්දේශය :

(1) පරිවර්තනය - කාර්යාලයීය ලියවිල්ලක් හෝ වාර්තාවකින් හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උද්ධෘතයක් ඇතුළු කාර්යාලයීය, විද්‍යාත්මක, නෛතික හා තාක්ෂණික ලියකියවිලිවලින් ද සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවලින් ද උපුටාගත් දුෂ්කර පාඨ කිහිපයක් පහත දැක්වෙන ආකාරවලින් එනම් (i) හෝ (ii) හෝ (iii) හෝ යන එක් ආකාරයකින් පරිවර්තනය කිරීම:-

(i) සිංහලෙන් දෙමළ බසට සහ දෙමළ බසින් සිංහලට;

(ii) සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහලට;

(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් දෙමළ බසට (පරිවර්තනයේ දී ඉතා උසස් කුසලතාවක් අපේක්ෂිතය),

ඉංග්‍රීසි/සිංහල/දෙමළ භාෂා ප්‍රශ්න පත්‍ර - මේ සඳහා භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර, සිය පරිවර්තන භාෂා මාධ්‍ය දෙක අනුව අදාළ පරිදි භාෂා දෙකක ප්‍රශ්නපත්‍රවලට අපේක්ෂකයන් පෙනී සිටිය යුතු ය.

(2) ඉංග්‍රීසි භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්තකොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණයවන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(3) සිංහල භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්තකොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(4) දෙමළ භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්තකොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(5) අවබෝධය - සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම පිළියෙල කරනු ලබන අවබෝධය ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයකුට ඉඩදෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයන්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැළපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරාගත යුතු වේ. අනෙක් පාඨ සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකිවන පරිදිය.

***සැ.යු.* - අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයකුගේ සුදුසුකම් අවලංගු කළ හැක.**

12.1.2. සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් **ලකුණු 40ක්** ලබාගන්නා අපේක්ෂකයන් අතරින් එම ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත පවත්නා පුරප්පාඩු අනුව පත්වීම් ලබාදෙනු ඇත.

12.2. සම්මුඛ පරීක්ෂණය - සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ සුදුසුකම්, සහතික සහ මනෝ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි. මේ සඳහා ලකුණු දෙනු නොලැබේ.

13.0 විභාග ප්‍රතිඵල :

*ගැසට්* නිවේදනයේ 12.1.2. ඡේදය අනුව සුදුසුකම් සපුරාලනු ලබන අපේක්ෂකයන්ගේ කුසලතා අනුපිළිවෙළට සකස් කළ ප්‍රතිඵල ලේඛනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබාදෙනු ඇත.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල ලේඛන ලබා දීම හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවියේ පළ කිරීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ඇත.

14.0 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මකවන බව සැලකිය යුතු ය. තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* මුල සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරස්‍රයේ
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශයේ දී ය.

11-131

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2025**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 34ක් සඳහා සුදුස්සන් විවෘත පදනමින් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 නොවැම්බර් මස 10 දින පෙ.ව. 9.00ට විවෘතවන අතර 2025 දෙසැම්බර් මස 08 දින ප.ව. 9.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 දෙසැම්බර් මස 08 වන දින වේ. මෙම විභාගය 2026 පෙබරවාරි මස කොළඹ දී පැවැත්වේ.**

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

i. ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

ii. පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය. තෝරාගනු ලබන අපේක්ෂකයින්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් මුළු ලකුණු ප්‍රමාණයෙන් 50%ක් වත් විය යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 අනුව ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1894/26 සහ 2014.12.26 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තාවූ ද මින් මතුවට සිදුකරනු ලැබිය හැකි වූද සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

v. ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

03. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 82,150 - 10x2,400 - 8x2,940 - 17x3,900 - රු. 195,970/- (SL 1 -2025) වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. අධ්‍යාපන සුදුසුකම් :

(1) පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(2). i. උපාධියක් ලබා තිබීම (මෙහි සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.);

*සහ*

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*සටහන* - මෙහි ඉහත 04. (1) සහ (2) i යටතේ වන උපාධි සුදුසුකම,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් විය යුතුය.

05. වයස් සීමාව : අවම සීමාව - අවුරුදු 21
උපරිම සීමාව - අවුරුදු 35
(ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2004.12.08 දින හෝ ඊට පෙර හා 1990.12.08 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

06. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

07. වෙනත් සුදුසුකම්:

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. බඳවා ගැනීමේ ක්‍රමය:

8.1 ලිඛිත විභාගය

8.1.1 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | පැය 2 | 100 | 40 |
| 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝගාතාව | පැය 2 | 100 | 40 |

*සටහන :* සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක්වත් අපේක්ෂකයා විසින් ලබා ගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50%ක්වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.1.2 විෂයය නිර්දේශය

| ***ප්‍රශ්න පත්‍රයේ නම*** | ***විෂයය නිර්දේශය*** |
|---|---|
| සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණයේ පරිකල්පන හැකියාවන්, තොරතුරු තාක්ෂණ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණ හැකියාව සහ දෙන ලද මාතෘකාවන්/තේමාවන් සඳහා පද්ධති විශ්ලේෂණය, සැලසුම්කරණය හා මෘදුකාංග පද්ධති හා වර්ධනය පිළිබඳ අපේක්ෂකයාගේ ශක්තිය මෙහි දී පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.) |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝගාතාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නව ප්‍රවණතා සහිතව මෘදුකාංග සංවර්ධනය, ස්ථාපනය හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වන දැනුම යොදා ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අයදුම්කරුගේ අභියෝගාතාව මැනීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

8.2 සම්මුඛ පරීක්ෂණය -

8.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:

සේවා ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

09. විභාග කොන්දේසි :

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනට ම පෙනී සිටිය යුතුය.

II. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු ය.

III. **මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය.** අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

***සටහන:*** ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

V. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

VI. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

VII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත

නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එම විස්තර සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VIII. ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

***සටහන:*** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

IX. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

X. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

XI. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XII. **ප්‍රතිඵල නිකුත් කිරීම** - ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද ඇතිව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

10\. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

11-132/1

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 14ක් සඳහා සුදුස්සන් සීමිත පදනමින් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 නොවැම්බර් මස 10 දින පෙ.ව. 9.00ට විවෘතවන අතර 2025 දෙසැම්බර් මස 08 දින ප.ව. 9.00ට අවසන් වේ.**

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 දෙසැම්බර් මස 08 වැනි දින වේ. මෙම විභාගය 2026 පෙබරවාරි මස කොළඹ දී පැවැත්වේ.**

1\. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2\. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසරක පරිවාස කාලයකට යටත් වන අතර බඳවාගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1894/26 සහ 2014.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තාවූ ද මින්මතු සේවා ව්‍යවස්ථාවට

කෙරෙන සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

v. ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

3. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 82,150 - 10x2,400 - 8x2,940 - 17x3,900 - රු. 195,970/- (SL 1 -2025) වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

4. **අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :**

4.1 පළපුරුද්ද -

(1) 2 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම ;

*හෝ*

(2) (අ) සේවයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති 2 පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු වීම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම;

*සහ*

(ආ) අංක 4.2 හි දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම;

*සහ*

(ඇ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම

4.2 අධ්‍යාපන සුදුසුකම් -

(1) පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/ පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(2) (i) උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය);

*සහ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*සටහන* - මෙහි ඉහත 4.2 (1) සහ (2) (i) යටතේ වන උපාධි සුදුසුකම,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ;

*හෝ*

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් විය යුතුය.

*සැ.යු.*- **මෙම අධ්‍යාපන සුදුසුකම් 4.1(1) හි දැක්වෙන නිලධාරීන් සඳහා අදාළ නොවේ.**

5. වයස් සීමාව : අදාළ නොවේ.

6. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

7. වෙනත් සුදුසුකම්:

i අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත්

භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. බඳවා ගැනීමේ ක්‍රමය:

8.1 ලිඛිත විභාගය

8.1.1 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමණාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 2 | 100 | 40 |

*සටහන:*

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.1.2 විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/ සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

8.2 සම්මුඛ පරීක්ෂණය

8.2.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සේවා ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලකුණු ලබාදෙනු නොලැබේ.

9. විභාග කොන්දේසි:

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය.

II. **මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය.** අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

***සටහන:*** ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

IV. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

VI. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

***සටහන:*** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

VII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එම විස්තර සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VIII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

IX. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

X. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XI. ප්‍රතිඵල නිකුත් කිරීම - ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද ඇතිව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

11-132/2

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2025.12.05 | සිකුරාදා | 2025.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.12 | සිකුරාදා | 2025.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.19 | සිකුරාදා | 2025.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.26 | සිකුරාදා | 2025.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජනවාරි** | 2026.01.02 | සිකුරාදා | 2025.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.09 | සිකුරාදා | 2025.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.16 | සිකුරාදා | 2026.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.23 | සිකුරාදා | 2026.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.30 | සිකුරාදා | 2026.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජූනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.